9A

147031

OL/2021(2022)/21/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** එක් වර ම සභාව **මියට පිඹිබාක් මෙන්** විය.
(1) තැනින් තැනින් ඉතා සුළු ශබ්ද මතු වූවාක් මෙන්
(2) කිසිදු ශබ්දයකින් තොර වූවාක් මෙන්
(3) කිහිප දෙනකු කතා කරද්දී අනික් අය නිහඬ වූවාක් මෙන්
(4) ඉහළට ඇද ගත් හුස්ම පහළට නොදමන්නාක් මෙන්

**2.** පොලිස් නිලධාරියා දුටු වහා ම සොරා **ගල් ගැසුණේ** ය.
(1) හිස නමා ගෙන සිටියේ ය. (2) බිමට නැමී සිටියේ ය.
(3) නො සෙල්වී සිටියේ ය. (4) දැත නො සෙල්වූයේ ය.

**3.** ජයග්‍රාහකයා **ඉහ වහා ගිය සතුටින්** ඔල්වරසන් දුන්නේ ය.
(1) ඉහටත් උඩින් ගිය සන්තෝෂයෙන් (2) සියල්ලන් පරදවන සතුටකින්
(3) සතුටු සහගත සිතින් (4) අධික වූ සන්තෝෂයෙන්

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** රටක ආර්ථිකය කඩා වැටීම ඒ රටෙහි ............................ හානිකර ය.
(1) ස්ථාවරත්වයට (2) අස්ථාවරත්වයට (3) ප්‍රමුඛත්වයට (4) සුන්දරත්වයට

**5.** මේ පොත තමා විසින් ම ලියන ලද හෙවත් ................................... චරිත කථාවකි.
(1) ස්වයං භාෂිත (2) ස්වයං නිර්මිත (3) ස්වයං ජනිත (4) ස්වයං ලිඛිත

**6.** 'ඝ' යන අක්ෂරය සිංහල භාෂාවෙහි ............................... යෙදේ.
(1) අවිශේෂයෙන් (2) දුර්ලභ ව (3) සුලභ ව (4) නිරන්තරයෙන්

[දෙවැනි පිටුව බලන්න.

NINE A | O/ L All Papers Download

9A



7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) මිණිමෙවුල, භෞතික, භීෂණය, දළදඬු
(2) දෝලනය, ඡේදය, ගුරුළා, හිනුම
(3) කොළය, පර්යේෂණ, නිගණ්ඨ, සක්වළ
(4) ප්‍රත්‍යක්ෂ, ආශ්චර්ය, සැණකෙළි, අනබෙරය

8. ගිගිරි, කෙක්ක, කුඹියා, සාගරය යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, දිගු පාපිල්ල, කොම්බුව
(2) දිගු පාපිල්ල, කොම්බුව, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල
(3) ඇලපිල්ල, දිගු පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කොම්බුව
(4) කෙටි ඉස්පිල්ල, කොම්බුව, දිගු පාපිල්ල, ඇලපිල්ල

9. 'තනතුර' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) දන්තජ හා මූර්ධජ ය. (2) දන්තජ හා ඕෂ්ඨජ ය.
(3) තාලුජ හා දන්තජ ය. (4) තාලුජ හා මූර්ධජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පෙළිය තෝරන්න.
(1) අඹ, අන්නාසි, අනෝදා, ඇපල්
(2) පේර, රඹුටන්, දෙළුම්, පැපොල්
(3) දිවුල්, නාරං, වරකා, හිඹුටු
(4) උගුරැස්ස, කෙසෙල්, මිදි, දොඩම්

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ඇතින්නක, මුගටියන්, සිංහයෝ, වඳුරා
(2) භික්ෂුවක, යාචකයන්, ළදරුවෙක්, වලසෙක්
(3) කුහුඹියෙක්, මානවයෙක්, සිවුපාවකු, රජකු
(4) කුරුල්ලකු, කිකිළියන්, වඳුරකු, ගුරුවරුන්

12. 'විදේශ සංචාරකයෝ දුම්රියෙන් බදුල්ලට යති' යන වාක්‍යයෙහි '**දුම්රියෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) කරණ (2) අවධි (3) කර්තෘ (4) සම්බන්ධ

13. 'යකඩදොර' යන්න අයත් වන්නේ,
(1) අන්‍යාර්ථ සමාසයට ය. (2) විශේෂණ සමාසයට ය.
(3) අව්‍යය සමාසයට ය. (4) විභක්ති සමාසයට ය.

14. 'සුන්දර + ය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) සුන්දරය (2) සෞන්දර්ය (3) සෞන්දර්‍ය (4) සෞන්දරය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - දුවන, පතිත, නටන, ගයන
(2) තද්ධිත - බලවත්, සිල්වත්, ඉසුරුමත්, අසිරිමත්
(3) මිශ්‍ර ක්‍රියා - කරමින්, දමමින්, ලියමින්, බලමින්
(4) නිපාත - දක්වා, පටන්, මෙන්, සෙන්

16. **අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) දරුවා අඬ අඬා දිවුවේ ය.
(2) මගිය, වහා ගමට යව.
(3) ඔවුන් වැඩ කරද්දී අපි බලා සිටියෙමු.
(4) තරුණිය සිනා සී පෙර මගට ආවා ය.

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. ඇයගේ **මන්දස්මිතය** කෙරෙහි ඔහුගේ සිත ඇදී ගියේ ය.
(1) පිරුණු සිනහව (2) මඳ සිනහව
(3) ළගන්නා සිනහව (4) සුන්දර සිනහව

[තුන්වැනි පිටුව බලන්න.

NINE A | O/ L All Papers Download

9A



18. නිවේදකයාගේ **කර්ණකඨෝර** ශබ්දය බොහෝ දෙනාගේ කතාබහට ලක් විය.
(1) කනට ඉමිහිරි
(2) කන්කලු වූ
(3) කන් පිනා යන
(4) කනට අමිහිරි

19. **සුවාසුදහසක්** යොදුන් දුර ඇත්තේ ය.
(1) අසූ දහසක්
(2) අසූ දහස් හතරක්
(3) අසූහාර දහසක්
(4) අසූහාර දහස් හතරක්

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවතිනා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) උදැල්ල, නගුල, හිරමනය, දැකැත්ත
(2) ළිඳ, වතුර, බාල්දිය, කඹය
(3) මාලය, මුද්ද, වළල්ල, කරාබුව
(4) කෝප්පය, ජෝග්ගුව, කේතලය, හැන්ද

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | මුහුද - සිඳු, | මිතුරු - පසමිතුරු, | චක්‍ර - රවුම්, | අත - බාහු |
| (2) | අග්නි - ගිනි, | නාසය - නැහැය, | භූමි - පොළොව, | තාරකා - තරු |
| (3) | පුස්තක - පොත, | ඥාති - නෑ, | වෘක්ෂ - ශාඛා, | මීයා - මූෂික |
| (4) | ගිරි - පර්වත, | නාග - නා, | කේශ - රෝම, | ප්‍රාකාර - අගල |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සිංහ - සිහ, මෘගරාජ, බාසුරු, මිගිඳා
(2) වනය - කැලය, වනාන්තරය, අටවි, මූකළාන
(3) ගවයා - වෘෂභ, ගොනා, හරකා, මෘග
(4) කිරණ - රශ්මි, කාන්ති, රැස්, කැන්

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) මධුර - සුමධුර
(2) සරල - සංකීර්ණ
(3) දේශීය - විදේශීය
(4) ආගමන - විගමන

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'එම්බල' යනු ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතයකි.
(2) 'නුඹ' යන්න මධ්‍යම පුරුෂ, ඒක වචන නාම පදයකි.
(3) 'ය, ර, ල, ව' යනු අන්තඃස්ථාක්ෂර ය.
(4) 'නරියෙක්' යන්නෙහි අනුක්ත රූපය 'නරියා' යන්න යි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) තැනිතලා, කඳු මුදුන් පසු කර යන ගංගා ජලය ආරම්භයේ දී ම සමුද්‍රයට එක් වේ.
(2) පාඨශාලා අධ්‍යාපනයේ මුඛ්‍ය ප්‍රතිලාභ අත්කර ගනුයේ ශිෂ්‍යයන් නො ව ගුරුවරුන් ය.
(3) මානව වර්ගයාගේ උන්නතිය සඳහා ප්‍රබුද්ධ මනසක් ද නීරෝගී ශරීරයක් ද අවශ්‍ය ය.
(4) ජලභීතිකා රෝගය නිසා සුනඛයන් පමණක් මරණයට පත් වනු දැක ගත හැකි ය.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. උගතුන් නැති තැන, මඳක් ඉගෙන ගත් තැනැත්තා ද උගතකු වශයෙන් පිළිගැනෙන බව
(1) ලූලා නැති වළට කණයා පණ්ඩිතයා ලු.
(2) ඉස්සෙල්ල ආපු කනට වඩා පස්සෙ ආපු අඟ ලොකු ලු.
(3) නටන්න බැරි මිනිහට පොළොව ඇදයි ලු.
(4) නිවට කරනවෑමියා දැක්ක ම එළවත් රැවුල පානව ලු.

27. සිතෙහි හටගත් කෝපය නිසි අයුරින් නොව වෙනත් ක්‍රමයකින් පිටකර හැරීම
(1) ගමරාල සිල් ගත්තා වාගේ
(2) ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වාගේ
(3) ගලෙන් පට්ටයක් ගන්නා වාගේ
(4) මුවහමට තඩි බාන්නා වාගේ



NINE A | O/ L All Papers Download

9A



28. ස්වර සන්ධියට හා පූර්ව රූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කම්මල, උනුන් (2) උනුන්, කම්මල
(3) උනුන්, අද්දැකීම (4) අද්දැකීම, කම්මල

● අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) සැමට සමාන ව සලකන උත්තමයකු බිහි වේවා!
(2) ගුරුවරු දරුවන්ගේ අනාගත යහපත වෙනුවෙන් වැඩ කළ යුතු ය.
(3) බොහෝ බුද්ධිමත්තු සැදැහැවත්තු නො වෙති.
(4) ශ්‍රී ලංකාව නොහොත් ඉන්දියන් සාගරයේ මුතු ඇටය අසිරිමත් දිවයිනකි.

30. (1) අක්කා ද මල්ලී ද මම ද පොත් පාඩම් කරමු.
(2) නගරාධිපති බලවතෙක් ද ධනවතෙක් ද ගුණවතකු ද වූයේ ය.
(3) ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව මෙවර තරගයට ඉදිරිපත් වන්නේ ය.
(4) දරුව, නිවටයෙක් සේ වැඩ නො කරව' යි තාපසයා කී ය.

31. ● දානපතියා අසරණයන්ට සැලකුයේ පින් ............................. ය.
● මෙහි ගැහැනු ළමයින් ............................. නවාතැන් පහසුකම් ඇත.
● ඒ ඉඩම් වෙන්දේසිය ............................. නගරාධිපතිගේ ප්‍රසාදයක් නො වී ය.
● දේශකයා සම්මන්ත්‍රණය පැවැත්වූයේ දෙමාපියන් ............................. ය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) ගැන, අරබයා, සඳහා, පිණිස (2) අරබයා, ගැන, සඳහා, පිණිස
(3) පිණිස, සඳහා, ගැන, අරබයා (4) සඳහා, ගැන, පිණිස, අරබයා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ඉලංදාරියා හැමදාම හැන්දෑ ජාමෙට වහං වෙනවා"
(1) තරුණයා සැම දිනක ම හවසට සැඟවුණේ ය.
(2) තරුණයා සැමදා ම රාත්‍රියෙහි සැඟවෙන්නේ ය.
(3) තරුණයා සැම දවසක ම සන්ධ්‍යාවෙහි හැංගුණේ ය.
(4) තරුණයා සැම දිනක ම සන්ධ්‍යා වේලාවෙහි සැඟවෙයි.

33. පහත දැක්වෙන ගීත ඛණ්ඩයේ අවසන් කොටස නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
ජාතියේ නාමයෙන්
සංග්‍රාම භූමියේ

.............................

(1) වීරයන්ගෙ ඒ යශෝ ගීතයයි.
(2) එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි.
(3) ජීවිතේ පුදා හැළූ ලේ කඳයි.
(4) සාර වූ උදාර වූ මාතෘ භූමියයි.

34. 'ශූර අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මයාවහ දක්ෂතාවන් විදහා දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයෙන් පුරවා දමමින් බස පාලනය කරයි'
ඉහත ප්‍රකාශයේ අදහස නිවැරදි ව කියැවෙන වාක්‍යය තෝරන්න.
(1) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් පුදුමය උපදවන දස්කම් දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ බස හසුරුවන්නේ විස්මය දනවන අයුරිනි.
(2) දක්ෂ අසරුවෙකු විස්මයෙන් යුතුව අසුන් මෙල්ල කරන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයා විස්මයට පත් කරමින් බස හසුරුවයි.
(3) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මය දනවන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද බස හසුරුවමින් පාඨකයාගේ සිත විස්මයට පත් කරයි.
(4) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මය දනවන ලෙස දස්කම් දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයට පත් වන ආකාරයට බස හසුරුවයි.

[පස්වැනි පිටුව බලන්න.

NINE A | O/ L All Papers Download

9A



**35.** 'ඇතැ ධූලින් වැසී ගිය ඇත් රජයැ මැතැ සවණක් ඝන බුදු රසින් සැදී ගිය බුදුරජාණෝ යැ. ඇතැ කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජයැ. මැතැ කරුණායෙන් තෙත් වැ ගිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණෝ යැ...'
යනාදි වශයෙන් ඇති පාඨය අන්තර්ගත වන කෘතිය කුමක් ද?

(1) පූජාවලිය (2) බුත්සරණ
(3) අමාවතුර (4) සද්ධර්මරත්නාවලිය

**36.** "වෛද්‍ය විද්‍යාලයෙන් මට වැටුපක් ලැබෙනවා. එය මට ප්‍රමාණවත්. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය මා සිතන හා පතන ආකාරයට ක්‍රියාත්මක කිරීමට ලැබුණොත් එය මට සතුටක්." මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) මහාචාර්ය කාලෝ ෆොන්සේකා (2) ආචාර්ය ඒ. ඩබ්. අදිකාරම්
(3) මහාචාර්ය සේනක බිබිලේ (4) මහාචාර්ය සෙනරත් පරණවිතාන

**37.** කෝට්ටේ අවධියේ දී රචනා කරන ලද සන්දේශ කාව්‍යයක් නොවන්නේ මින් කුමක් ද?

(1) පරෙවි සන්දේශය (2) සැළලිහිණි සන්දේශය
(3) ගිරා සන්දේශය (4) මයූර සන්දේශය

**38.** "අතිගම්භීර ප්‍රපාතයෙහි වැටී ක්ෂුධාවෙන් පෙළී කෙඳිරිගාමින් හොත් පුරුෂයා දැක ..." යන පාඨයෙහි 'ක්ෂුධාවෙන්' යන්නෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) මහන්සියෙන් (2) කුසගින්නෙන්
(3) පිපාසයෙන් (4) බියෙන්

**39.** රූපකයක් ඇතුළත් වන උත්තරය තෝරන්න.

(1) ජීවන ගංගාව (2) රිය සකයුරු
(3) ඉඳුනිල් මිණි රුවනක් බඳු (4) දිදි රනලියෙව්

**40.** ධීවර වෘත්තිය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'මරක්කලාහේ' යනු

(1) දැල් අදින පුද්ගලයා ය. (2) ඔරු අයිතිකරුවා ය.
(3) ධීවර කණ්ඩායමේ නායකයා ය. (4) ඔරුව පදවන පුද්ගලයා ය.

* *

[හයවැනි පිටුව බලන්න.

NINE A | O/ L All Papers Download

9A



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පිලි නියෝජනය වන ස්වර අක්ෂර ලියන්න.
  (අ) කෙටි පාපිල්ල
  (ආ) ගැට ඇලපිල්ල

(ii) පහත සඳහන් පද නිවැරදි ව සන්ධි කර ලියන්න.
  (අ) මිණි + අබරණ (ආ) නි + අවුල්

(iii) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
  ගෝලීය වසංගත හේතු කොට ගෙන ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් විවිධ නව නිශ්පාදන වෙළෙඳපොලට එක් වී ඇත.

(iv) පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** නිවැරදි ව ලියන්න.
  (අ) කද (ආ) කඳ

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
  (අ) ඔවුහු විදේශිකයන් ය.
  (ආ) වෛද්‍යවරු රෝගීහු සුවපත් කරති.

(vi) "ඇ දෙමාපියන් **දැක** අත **වනමින්** ඉදිරියට ම දිව ගියා ය." යන වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය ලියන්න.

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
  දර කපන්නා සුළඟින් ඉදිරී වැටුණු ගස ඉවත් කරයි.

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
  (අ) කැඩුණු බිඳුණු දෙයක් නැවත සකස් කිරීම
  (ආ) ජලයෙහි හැසිරෙන

(ix) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
  (අ) නිශ්චිත (ආ) උපන්

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
  (අ) සංචාරකයන් විසින් ඇත්තු නරඹනු ලබති.
  (ආ) අප විසින් රෝහලට ඖෂධ තොගයක් පරිත්‍යාග කරන ලදි.

(ලකුණු 02 × 10 = 20 යි)

NINE A | O/ L All Papers Download

9A



**2.** පහත දැක්වෙන **(අ). (ආ). (ඉ). (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ශ්‍රී ලංකාව වර්ෂයේ මාස කිහිපයක් පුරා ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබෙන රටකි. කෘෂිකාර්මික කටයුතුවලට, ජල විදුලිය උත්පාදනය කිරීමට මෙන් ම පානීය අවශ්‍යතා සපුරා ගැනීමටත් මේ වර්ෂා ජලය ප්‍රයෝජනයට ගැනෙයි. වැසි නොලැබෙන මාසවල දී උග්‍ර ජල හිඟයකට මෙරට ජනතාවට මුහුණපෑමට සිදු වී ඇත්තේ වර්ෂා ජලය නිසි පරිදි සංරක්ෂණය කර ගැනීමේ වැඩපිළිවෙළක් නොමැති වීම හේතුවෙනි. එබැවින් වර්ෂා ජලය අපතේ යාමට ඉඩ නො තබා පසුව ප්‍රයෝජනයට ගැනීම සඳහා සුරක්ෂිත ව තබා ගැනීමේ විධිමත් ක්‍රියා පිළිවෙතක් පිළිබඳ අවධානය යොමු කිරීමට කාලය එළඹ තිබේ.

**(ආ)** ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් ව තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සෑම පුද්ගලයකුට ම පාහේ තම රට, ජාතිය සහ ආගම පිළිබඳ ව පවතින හැඟීම අමතක ව ගොස් ඇත. ශ්‍රී ලංකාවට ද මේ තත්ත්වය පොදු ය. ඊට පිළියමක් වශයෙන් තරුණ ප්‍රජාව තුළ දේශානුරාගය මතු කරවීමට සිදු ව තිබේ. ඒ සඳහා යොදා ගත හැකි විවිධ සාහිත්‍යාංග අතුරෙන් දේශානුරාගී ගීතවලට ප්‍රමුඛත්වයක් හිමි වේ. මේ අනුව ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි ජනමාධ්‍යවලින් ප්‍රචාරය කෙරෙන හරසුන් වැඩසටහන් වෙනුවට දේශානුරාගය දනවන ගීත ප්‍රචාරය කෙරෙන වැඩසටහන් ද ඇතුළත් කිරීම කාලෝචිත ය.

**(ඉ)** මිනිසුන්ගේ දෛනික පරිභෝජනයට ප්‍රමාණවත් පරිදි ඉන්ධන නොමැති වීම වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින ප්‍රබල අර්බුදයකි. මේ අර්බුදයට විසඳුම් සෙවීමේ දී ප්‍රමාණවත් ලෙස ඉන්ධන ගෙන්වා බෙදා හැරීම පිළිබඳ ව මෙන් ම අනවශ්‍ය ආකාරයට සිදුවන ඉන්ධන දහනය වැළැක්වීම පිළිබඳ ව ද අවධානය යොමු විය යුතු ය. නාගරික ප්‍රදේශවල පවතින අධික රථවාහන තදබදය අනවශ්‍ය ආකාරයට ඉන්ධන දහනය වීමට හේතු වී ඇති ප්‍රබල සාධකයක් බැවින් එය අවම කිරීමට ද පිළියම් යෙදිය යුතු ය.

**(ඊ)** අතීත මිනිසුන්ගේ කුසලතා හා කලාත්මක චින්තනය පිළිබිඹු කෙරෙන පුරාවස්තු සංරක්ෂණය කිරීම පිළිබඳ ලෝකයේ සෑම රටක් ම විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කරනු දැකිය හැකි ය. ලෝකයේ කිසිදු රටකට දෙවැනි නොවන තරමේ අනර්ඝ පුරාවස්තු සම්භාරයක් ශ්‍රී ලංකාවේ ද පවතී. නරඹන්නන්ගෙන් මෙන් ම සොර-සතුරන්ගෙන් ද මේ පුරාවස්තුවලට සිදුවන අලාභහානි පිළිබඳ ව මේ දිනවල ජනමාධ්‍ය නිතර ම තොරතුරු හෙළි කරයි. දැනට පවතින නීති-රීති ක්‍රියාත්මක කිරීමත් නව නීති-රීති සම්පාදනය කිරීමත් විවිධ උපක්‍රම භාවිත කරමින් මිනිසුන් තුළ ඒවා පිළිබඳ ඇල්මක් ඇති කරවීමත් මෙරට පුරාවස්තු සංරක්ෂණය කර ගැනීමට ඉවහල් වනු ඇත.

(ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

19 වන සියවසේ දී ජනසන්නිවේදනය ලොව පුරා වඩාත් ප්‍රචලිත වන්නට විය. එමගින් නව සංස්කෘතියක් බිහිවන්නට වූ අතර එම සංස්කෘතිය වඩා වේගයෙන් ලොව පුරා ව්‍යාප්ත වන්නට වූයේ වඩාත් ජනප්‍රිය වෙමිනි. මෙහි ආරම්භක මාධ්‍යය වශයෙන් කටයුතු කළේ පුවත්පත යි. පුවත්පත මගින් ඇති කළ මේ නව සංස්කෘතිය විද්‍යුත් මාධ්‍යවල ප්‍රභවය සමග වෙනස් වූ අතර එම තත්ත්වය රූපවාහිනී මාධ්‍යය අත්කර ගන්නා ලද්දේ ග්‍රාහකයාගේ නිවසේ අනිවාර්ය මෙවලමක් බවට පත්වෙමිනි. ගුවන්විදුලි මාධ්‍යයේ ම දිගුවක් වශයෙන් බිහි වූ රූපවාහිනී මාධ්‍යය හුදකලා මාධ්‍යයක් ලෙස ගොඩනැගුණක් නො වේ. එය සිනමාව, නිශ්චල ඡායාරූපය හා ගුවන් විදුලි මාධ්‍යය ආශ්‍රයෙන් බිහි වූ මාධ්‍යයක් වේ. එහෙත් මේ සියලු මාධ්‍යයන්ට වඩා රූපවාහිනී මාධ්‍යය ග්‍රාහකයාට සමීප වූ අතර එය ගෘහස්ථ භාණ්ඩයක් බවට පරිවර්තනය විය. ඒ නිසා රූපවාහිනිය වඩා ප්‍රබල මාධ්‍යයක් වෙමින් ලෝකය පුරා ප්‍රචලිත විය.

රූපවාහිනී මාධ්‍යයේ ශක්‍යතා හා තාක්ෂණික ප්‍රවණතා පදනම් කර ගනිමින් රූපවාහිනියට දේශසීමා හඬා යාමේ හැකියාව අත් වූ අතර එයින් ලෝකය වඩාත් අන්‍යෝන්‍ය වශයෙන් සමීප විය. සන්නිවේදන ක්‍රියාවලියේ දී වඩාත් ප්‍රබල මාධ්‍යයක් වීමට අවකාශය සලසා ගන්නා ලද්දේ එමගින් ය. අද්‍යතනයේ දී ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති අතර එකී විශ්ව ගම්මානයක ජනමාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. සීමා මායිම් අතික්‍රමණය කරමින් ගොඩනැගී ඇති මේ නව්‍ය වූ ලෝකයේ ජනතාවගේ දැනුවත් බව උදෙසා තොරතුරු සන්නිවේදනය කෙරෙන මාධ්‍යයක් වශයෙන් ද විනෝදාස්වාදන මාධ්‍යයක් වශයෙන් ද රූපවාහිනිය ඉතා වැදගත් සාධකයක් බවට පත් ව තිබේ.

(ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

NINE A | O/ L All Papers Download

9A



4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ළමා සාහිත්‍යයේ අරමුණ විය යුත්තේ සාහිත්‍ය කටයුතු අනුසාරයෙන් නිරවද්‍ය චින්තනයෙන් ප්‍රභාවිත විවිධ විෂයයන් හා විපුල ක්‍රමයන් පිළිබඳ සාරගර්භ ශික්ෂණයක් හා නිර්මාණ ක්‍රියාවේගයන් ජනනය කෙරෙන ශික්ෂණයක් කරා බාල පරපුර මෙහෙයවීම යි. අස්වාභාවික නොවන සේ රචිත විධිමත් ළමා සාහිත්‍ය කෘති මගින් ළමා මනුස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වළක්වාලීමට සැලකිය යුතු පිටුබලයක් සැපයෙයි. මූලික වශයෙන් වර්ග දෙකකට බෙදෙන ළමා සාහිත්‍ය කෘතිවලින් එක් වර්ගයක් සෞන්දර්යාවබෝධය හා වින්දනය ලබා දීමේ කරණීය ආකල්ප තහවුරු කරයි. අනෙක් වර්ගය ළමයා අවට ලෝකයේ පවතින විවිධ ධර්මතා පිළිබඳ අවබෝධය ලබා දෙයි.

ළමා ලෝකයේ පවතින රසවත් සංකල්පනා පදනම් කර ගැනුණු රචනා කියවීමට ළමයින් තුළ පවතින්නේ බලවත් ආශාවකි. ජනකතා, ජන ගී ජන කාව්‍ය ආදි ජනශ්‍රැති අංග කෙරෙහි ද ස්වකීය ආගමික සිතුම්-පැතුම් හා ප්‍රතිඥාවන් වස්තු බීජ කර ගත් සරල නිර්මාණ කෘති කෙරෙහි ද ළමා රුචිය ඉස්මතු වෙයි. ස්වභාවධර්මයේ විවිධාංග, විද්‍යාංග, ඓතිහාසික වෘත්තාන්ත හා තත්කාලීන සිදුවීම් යනාදි විෂයයන් පිළිබඳ ව ළමා මනස මෙහෙයවීමට සූක්ෂ්ම ලෙස නිර්මාණය කෙරෙන කෘති යොදා ගත හැකි ය. දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල ස්වභාව විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මූල දැනුමක් ලබා දෙමින් රචිත පොත්වලට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. එම කෘති මගින් ළමයින්ගේ චින්තන ශක්තිය පුළුල් වේ. ස්වභාවධර්මය පිළිබඳ විමසිල්ලෙන් පරීක්ෂා කොට, එය අභිබවා ක්‍රියා කිරීමේ හැකියාව වර්ධනය වේ. ලෝකයේ සෑම රටක ම වෙසෙන ළමයින් සාමාන්‍යයෙන් ඒකාකාර වුව ද ඔවුන් සඳහා ලියැවෙන කෘති රටින් රටට වෙනස් වේ. එසේ වෙනස් වන්නේ විවිධ චර්යාවන් හා ඒවායේ ප්‍රතිඵලවලින් ගොඩනැගී ඇති පුරුෂාර්ථ ගැබ්කොට ගත් සංස්කෘතික රටාවේ බලපෑම නිසා ය. මේ අනුව විමසිලිමත් වන විට බටහිර රටවල ළමා සාහිත්‍ය කෘතිවලට වඩා ලංකාවේ ළමයින්ට ආසියාතික රටවල නිර්මාණය වූ කෘති ප්‍රියජනක වන බව පෙනේ.

ළමා සාහිත්‍ය කෘතීන්හි භාෂාව කෙරෙහි ද අපගේ අවධානය විශේෂයෙන් යොමු විය යුතු වේ. ළමයින් කතා කරන භාෂාව ග්‍රන්ථ භාෂාවට වඩා ප්‍රාණවත් ය. මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන පොත් ළමා ව්‍යවහාරානුසාරී වූ ද මානසික පරිසරයට අනුකූල වූ ද භාෂා ස්වරූපයෙන් යුක්ත විය යුතු ය.

(i) ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වැළැක්වීමට උපකාරී වන්නේ කවර වර්ගයේ කෘති ද?

(ii) මේ ඡේදයේ දැක්වෙන ජනශ්‍රැති අංග මොනවා ද?

(iii) ළමා මනස මෙහෙයවීමට සූක්ෂ්ම ලෙස නිර්මාණය කෙරෙන කෘති සඳහා යොදා ගත හැකි විෂයයන් **දෙකක්** නම් කරන්න.

(iv) දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල විශේෂ අවධානයක් යොමු වන්නේ කවර වර්ගයේ කෘති කෙරෙහි ද?

(v) මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන කෘතිවල භාෂා ස්වරූපය කෙබඳු විය යුතු ද?

(ලකුණු 02 × 5 = 10 යි)

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන **දැන්වීම් පත්‍රිකාවක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**'උදාර'** යනු පෞද්ගලික කර්මාන්තායතනයක සේවක සුභසාධක සංගමයකි. එහි මාසික රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කෙරිණි.

- තම සංගමය මගින් සමාජ සත්කාර සේවා රැසක් සිදු කරන බව
- වාර්ෂික ලේ දන් දීමේ කඳවුර 2022 වර්ෂයේ ද සංවිධානය කළ යුතු බව
- එය දෙසැම්බර් 20 දින සිදු කළ යුතු බව
- ලේ දන් දීමේ කඳවුර සඳහා කර්මාන්තශාලාවේ සේවක විවේකාගාරය සූදානම් කළ යුතු බව

උදාර සුභසාධක සංගමයේ ලේකම් 'දේවිකා අබේරත්න' ඔබ යයි සිතන්න.

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **රාජකාරි ලිපියක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**'සමගිපුර'** ග්‍රාම සංවර්ධන සමිතියේ මෙවර රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය විය.

- සමගිපුර ගම මැදින් වැටී ඇති දුම්රිය හරස් මාර්ගය අනතුරු බහුල ස්ථානයක් වී ඇති බව
- දුම්රිය ගේට්ටුවක් නොමැතිකම මීට ප්‍රධාන හේතුව වී ඇති බව
- මේ වන විටත් ජීවිත හානි කිහිපයක් ම සිදු ව ඇති බව
- දුම්රිය ගේට්ටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දුම්රිය අධිකාරිවරයාගෙන් ඉල්ලීමක් කළ යුතු බව

සමගිපුර ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් 'රසික ආරියරත්න' ඔබ යයි සිතන්න.

(ලකුණු 15 යි)

* * *

NINE A | O/ L All Papers Download

9A

147031

OL/2021(2022)/21/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය III**<br>சிங்களமொழியும் இலக்கியமும் III<br>Sinhala Language and Literature III | | **පැය දෙකයි**<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) දුරුතු මහේ දී කැලයට වැදීලා
........................................ ..........
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා

(අ) මෙම කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.
(ආ) ජනවාරි මාසය හැඳින්වීමට කවියේ යෙදී ඇති වචනය කුමක් ද?

(ii) ස න් න න් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන
තැ න් තැ න් වල ම සැතැපී සියුමැලි බැවින
ර න් ව න් කරල් ගෙනෑ එන ගිරවුන් අතින
**ය න් ම න් තොසින් මග තොරතුරු නියම දැන**

(අ) මෙම පද්‍යය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස ලියන්න.

(iii) "ඔව්! හැමදේම බැහ්! බැහ්! කට විතරයි හොල්ලන්න පුළුවන්. අතක් හොල්ලන්න එපා!"

(අ) මෙම ප්‍රකාශය කළ අයගේ නම කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව ලියන්න.

(iv) ඇසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ

(අ) මෙම පද්‍යය ඇතුළත් පැදි පෙළෙහි රචකයා කවරෙක් ද?
(ආ) පුංචි පුතා රජ කරනු පෙනෙන්නේ කවර අවධියක ද?

(v) "ගං ඉවුරෙ අලි ඇට නරි අදිනවා කියලා අනිත් අලි ගඟේ නාන්නේ නැතුව අරිනවා ද?"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය හා සබැඳුණු අවස්ථාව කුමක් ද?

(vi) "කොල පව්ටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෘතිය නම් කරන්න.
(ආ) මෙහි 'බමුණු මහල්ල' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇති තැනැත්තාගේ නම කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

9A



(vii) "අපි ආපු පාර දිගේ ආපහු පයින් ම මං යන්නම්" යි ඔහු කී ය. "පයින් ම ගිහිල්ලා හොයා ගන්න පුළුවන් ද කියලා බලන්නම්"

(අ) මෙම කොටස උපුටා ගත් නිර්මාණයේ මුල් රචකයාගේ නම ලියන්න.

(ආ) මෙහි සඳහන් තැනැත්තා සොයා ගැනීමට උත්සාහ කළේ කුමක් ද?

(viii) "තමන් පානා කෙළි තමන් ම දක්නා පමණ මුත් රැස් වූවවුන් නො බලන නියාව දැන මුසුප්පු ව ගොසින්"

(අ) මෙහි 'තමන්' යනුවෙන් හැඳින් වූ අයගේ නම කුමක් ද?

(ආ) රැස් වූ පිරිස බලා සිටියේ කවුරුන් දෙස ද?

(ix) (අ) හංස සන්දේශය රචනා වී ඇත්තේ කවර යුගයක ද?

(ආ) හංස සන්දේශය මගින් සෙත් පැතීමට අපේක්ෂා කෙරෙන්නේ කිනම් රජතුමාට ද?

(x) (අ) සිංහල භාෂාවෙන් ලියැවී ඇති පැරණි විනය ග්‍රන්ථයක් නම් කරන්න.

(ආ) කුස ජාතක කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවරෙක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) මෙහි දැක්වෙන උපමාව කුමක් ද?

(ආ) පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(ii) කිම් ද මෑණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය
ඇසෙන මෙ අරුමා

(අ) මෑණියන් තම දරුවන් අමතා පවසන්නට යෙදුණු කාරණය කෙටියෙන් ලියන්න.

(ආ) මෑණියන්ගේ ප්‍රකාශයෙන් අනතුරුව සිංහබාහු ක්‍රියා කළ ආකාරය කෙබඳු දැයි විස්තර කරන්න.

(iii) "මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්හු ඔවුන් දැකැ වෙවුලත් මැ යැ. පලත් මැ යැ. දොරපියා-ලත් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම අසමින් පලා **වලට** හො වදිති. ගෙට වැදැ දොර පියා-ලා අගුළු හො ගන්ති. පලා නො යා හෙන්නාහු පිටි පෑ සිටුති. මහතෙරහු **සරළුවක්** හඹු දු කෙණෙස්සක් බතු දු නො ලැබෙති."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) අඟුල්මල් තෙරුන් දුටු මිනිසුන් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iv) නොයෙක් තැන ම පිපි මල් පිරුණු පො**කුණුය**
ගෙයක් කන ම සැදැහෙන් දෙවන **දකුණුය**
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද **පැදකුණුය**

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) පරිසරයේ සුන්දරත්වය හා මිනිසුන්ගේ ක්‍රියාකලාප ගැන කවියා දක්වා ඇති තොරතුරු මොනවා ද?

(v) "සිංහ නාද ඇසූ මුව පොල්ලුන් පරිද්දෙන් තොපගේ අභීත ශබ්දයෙන් ම උන් භය ගන්වා යමුගුරු බා ලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තු තු කොට පියා වහා රා මස් අවුළු විසුරුවා නො කෑ හැකි පරිද්දෙන් කොට දිවීමෙන් ගොස් සේනා මධ්‍යයට වැද, ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන් මහත් අරගල කොට, 'අපි මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයම්හ. පිළිවන් වී නම් අප අල්ලා ගනුව' යි තොප ගිය බව හඟවා එව".

(අ) මෙම පාඨයේ දැක්වෙන උපමා **දෙක** උපුටා ලියන්න.

(ආ) මහෞෂධ පණ්ඩිතයන් යෝධයන්ට මෙලෙස උපදෙස් දීමට හේතු වූ කාරණය කෙටියෙන් ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)



NINE A | O/ L All Papers Download

9A



3. • චූලනී බ්‍රහ්මදත්ත රජුගේ චරිතයත්
   • වේදේහ රජුගේ චරිතයත්

   උම්මග්ග ජාතකයේ නිරූපණය කර ඇති ආකාරයෙන් ස්ඵුට වන්නේ රාජ්‍ය පාලනයේ දී කෘතහස්ත උපදේශකයන්ගේ සේවයේ අවශ්‍යතාව යි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

   • භාෂාව සුමට ලෙස හසුරුවා ගැනීම
   • අවස්ථෝචිත ලෙස සිද්ධි පෙළ ගැස්වීම මගින්

   ගුත්තිල කවියාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය පිළිබිඹු කෙරෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

4. • අජීව වස්තූන්ට සජීව ස්වරූපය ආරෝපණය කිරීමත්
   • උචිත බස් වහරක් යොදා ගැනීමත්

   'වස්සානය' කවි පෙළෙහි සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

   • ගැමි බස්වහරක් යොදා ගැනීමත්
   • සිද්ධි හා අවස්ථා මනා ලෙස ගැළපීමත් නිසා

   'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක ආකර්ෂණය දිනා ගැනීමට සමත් ව ඇත.
   එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

• **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන්නේ නූගත් ගැමි ජනතාවගේ අව්‍යාජ සිතුම් පැතුම් ය. නිර්දිෂ්ට කොටස ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

6. අඟුල්මල් දමනයෙහි දැක්වෙන දිසාපාමොක් ඇදුරු චරිතය මගින් විදහා දැක්වෙන්නේ ද අර්බුද හමුවේ මිනිස් සිත ක්‍රියා කරන සාමාන්‍ය ස්වභාවය යි. අමාවතුර නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. මිනිස් දිවිය සහ සොබා දහම සංකලනය කරමින් ජීවන දර්ශනයක් මතුකොට දැක්වීමට කවියා ගෙන ඇති උත්සාහය කෙතෙක් දුරට සාර්ථක වී ඇද්ද යි 'ගංගාවේ සංගීතය' පැදිපෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

* * *

9A

NINE A | O/ L All Papers Download

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021(2022)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2021(2022)

| විෂය අංකය<br>பாட இலக்கம் | 21 | විෂයය<br>பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 2 | 31. | 3 |
| 02. | 3 | 12. | 1 | 22. | 3 | 32. | 4 |
| 03. | 4 | 13. | 4 | 23. | 1 | 33. | 3 |
| 04. | 1 | 14. | 2 | 24. | 4 | 34. | 4 |
| 05. | 4 | 15. | 4 | 25. | 3 | 35. | 2 |
| 06. | 2 | 16. | 3 | 26. | 1 | 36. | 3 |
| 07. | 3 | 17. | 2 | 27. | 4 | 37. | 4 |
| 08. | 4 | 18. | 4 | 28. | 2 | 38. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 3 | 39. | 1 |
| 10. | 3 | 20. | 1 | 30. | 1 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | |
|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25<br>40 |

| | |
|---|---|
| I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25<br>40 |



CamScanner

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## IIපත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

ඉගෙනුම් පල -

අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.

සඤ්ඤක අකුරු හඳුනාගෙන නිවැරදි ව භාවිත කරයි.

භාෂා භාවිතයේ දී වචන අර්ථවත් ව යොදයි.

ක්‍රියා පද නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

පද නිවැරදි ව සන්ධි කරයි.

ප්‍රත්‍යයාර්ථ නාම පද හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.

උක්තය, කර්මය හා ආඛ්‍යාතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.

වාක්‍ය රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

CS CamScanner

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්ත... **කොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පිලි නියෝජනය වන ස්වර අක්ෂර ලියන්න.
   (අ) කෙටි පාපිල්ල
   (ආ) ගැට ඇලපිල්ල

(ii) පහත සඳහන් පද නිවැරදි ව සන්ධි කර ලියන්න.
   (අ) මිණි + අබරණ   (ආ) නි + අවුල්

(iii) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
   ගෝලීය වසංගත හේතු කොට ගෙන ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් විවිධ නව නිශ්පාද... වෙළෙඳපොලට එක් වී ඇත.

(iv) පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** නිවැරදි ව ලියන්න.
   (අ) කද   (ආ) කඳ

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
   (අ) ඔවුහු විදේශිකයන් ය.
   (ආ) වෛද්‍යවරු රෝගීහු සුවපත් කරති.

(vi) "ඈ දෙමාපියන් **දැක** අත **වනමින්** ඉදිරියට ම දිව ගියා ය." යන වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය ලියන්න.

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
   දර කපන්නා සුළඟින් ඉදිරී වැටුණු ගස ඉවත් කරයි.

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
   (අ) කැඩුණු බිඳුණු දෙයක් නැවත සකස් කිරීම
   (ආ) ජලයෙහි හැසිරෙන

(ix) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
   (අ) නිශ්චිත   (ආ) උපත්

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
   (අ) සංචාරකයන් විසින් ඇත්තු නරඹනු ලබති.
   (ආ) අප විසින් රෝහලට ඖෂධ තොගයක් පරිත්‍යාග කරන ලදී.

(ලකුණු 02 × 10 = 20 යි)

(i) උ, ඍ

(ii) මිණිබරණ

නිරවුල්

(iii) (අ) නිෂ්පාදන

(ආ) වෙළෙඳපොළ | වෙළඳපොළට

(iv) අර්ථවත් වාක්‍ය දෙකක් ලියා තිබීම

කඳ - කරමත තබාගෙන යන කඳ

කඳ - ගසක කඳ හෝ පුද්ගල ශරීරය

(v) (අ) ඔවුහු විදේශිකයෝ ය.

(ආ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කෙරෙති/ කරනු ලබති/ ලබත්/ ලැබෙති/ ලැබෙත්.

(vi) දැක - පූර්ව ක්‍රියා/ පෙර කිරිය

වනමින් - මිශ්‍ර ක්‍රියා/ මුසු කිරිය

(vii) (අ) කපන්නා, වැටුණු

(viii) (අ) ප්‍රතිසංස්කරණය / පිළිසකර

(ආ) ජලවර

(ix) (අ) අවිනිශ්චිත

(ආ) නූපන්

(x) (අ) සංචාරකයෝ ඇතුන් නරඹති.

(ආ) අපි රෝහලට ඖෂධ තොගයක් පරිත්‍යාග කළෙමු.

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව මැනීම**

මෙ ප්‍රශ්නය සැකසීමෙ දි අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් ලිවීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

**ඉගෙනුම් පල -**

- **රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.**
- **රැස් කරගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.**
- **ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.**
- **නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.**

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන ලේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව වර්ෂයේ මාස කිහිපයක් පුරා ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබෙන රටකි. කෘෂිකාර්මික කටයුතුවලට, ජල විදුලිය උත්පාදනය කිරීමට මෙන් ම පානීය අවශ්‍යතා සපුරා ගැනීමටත් මේ වර්ෂා ජලය ප්‍රයෝජනයට ගැනෙයි. වැසි නොලැබෙන මාසවල දී උග්‍ර ජල හිඟයකට මෙරට ජනතාවට මුහුණපෑමට සිදු වී ඇත්තේ වර්ෂා ජලය නිසි පරිදි සංරක්ෂණය කර ගැනීමේ වැඩපිළිවෙළක් නොමැති වීම හේතුවෙනි. එබැවින් වර්ෂා ජලය අපතේ යාමට ඉඩ නො තබා පසුව ප්‍රයෝජනයට ගැනීම සඳහා සුරක්ෂිත ව තබා ගැනීමේ විධිමත් ක්‍රියා පිළිවෙතක් පිළිබඳ අවධානය යොමු කිරීමට කාලය එළඹ තිබේ.

(ආ) ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් ව තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සෑම පුද්ගලයකුට ම පාහේ තම රට, ජාතිය සහ ආගම පිළිබඳ ව පවතින හැඟීම අමතක ව ගොස් ඇත. ශ්‍රී ලංකාවට ද මේ තත්ත්වය පොදු ය. ඊට පිළියමක් වශයෙන් තරුණ ප්‍රජාව තුළ දේශානුරාගය මතු කරවීමට සිදු ව තිබේ. ඒ සඳහා යොදා ගත හැකි විවිධ සාහිත්‍යාංග අතුරෙන් දේශානුරාගී ගීතවලට ප්‍රමුඛත්වයක් හිමි වේ. මේ අනුව ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි ජනමාධ්‍යවලින් ප්‍රචාරය කෙරෙන හරසුන් වැඩසටහන් වෙනුවට දේශානුරාගය දනවන ගීත ප්‍රචාරය කෙරෙන වැඩසටහන් ද ඇතුළත් කිරීම කාලෝචිත ය.

(ඉ) මිනිසුන්ගේ දෛනික පරිභෝජනයට ප්‍රමාණවත් පරිදි ඉන්ධන නොමැති වීම වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින ප්‍රබල අර්බුදයකි. මේ අර්බුදයට විසඳුම් සෙවීමේ දී ප්‍රමාණවත් ලෙස ඉන්ධන ගෙන්වා බෙදා හැරීම පිළිබඳ ව මෙන් ම අනවශ්‍ය ආකාරයට සිදුවන ඉන්ධන දහනය වැළැක්වීම පිළිබඳ ව ද අවධානය යොමු විය යුතු ය. නාගරික ප්‍රදේශවල පවතින අධික රථවාහන තදබදය අනවශ්‍ය ආකාරයට ඉන්ධන දහනය වීමට හේතු වී ඇති ප්‍රබල සාධකයක් බැවින් එය අවම කිරීමට ද පිළියම් යෙදිය යුතු ය.

(ඊ) අතීත මිනිසුන්ගේ කුසලතා හා කලාත්මක චින්තනය පිළිබිඹු කෙරෙන පුරාවස්තු සංරක්ෂණය කිරීම පිළිබඳ ලෝකයේ සෑම රටක් ම විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කරනු දැකිය හැකි ය. ලෝකයේ කිසිදු රටකට දෙවැනි නොවන තරමේ අනර්ඝ පුරාවස්තු සම්භාරයක් ශ්‍රී ලංකාවේ ද පවතී. නරඹන්නන්ගෙන් මෙන් ම සොර-සතුරන්ගෙන් ද මේ පුරාවස්තුවලට සිදුවන අලාභහානි පිළිබඳ ව මේ දිනවල ජනමාධ්‍ය නිතර ම තොරතුරු හෙළි කරයි. දැනට පවතින නීති-රීති ක්‍රියාත්මක කිරීමත් නව නීති-රීති සම්පාදනය කිරීමත් විවිධ උපක්‍රම භාවිත කරමින් මිනිසුන් තුළ ඒවා පිළිබඳ ඇල්මක් ඇති කරවීමත් මෙරට පුරාවස්තු සංරක්ෂණය කර ගැනීමට ඉවහල් වනු ඇත.

(ලකුණු 25 යි)

(අ) වැසි ජලය සංරක්ෂණය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග

වර්ෂා ජලය සුරක්ෂිත ව තබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක අවශ්‍යතාව

(ආ) රටදැයසමය පිළිබඳ හැඟීම් ජනනයෙහි ලා දේශානුරාගී ගීතයේ දායකත්වය

ජනමාධ්‍යවලින් දේශානුරාගී ගීත ප්‍රචාරය කිරීමේ කාලෝචිතභාවය

(ඉ) ප්‍රමාණවත් අවධානයක් යොමු නො වුණු ඉන්ධන අර්බුදය

- අනවශ්‍ය ඉන්ධන දහනය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

(ඊ) පුරාවස්තු රැක ගැනීමේ නව වැඩ පිළිවෙළක අවශ්‍යතාව

පුරාවස්තු සංරක්ෂණය හා මානව ආකල්ප සංවර්ධනය

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි. |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි. |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි. |

01. සාරවත්භාවය - ලකුණු 07 යි.

විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

CamScanner

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි.**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යූහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යූහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

* (ඊ) සඳහා පිළිතුර අතීත කාලයෙන් ලියා තිබුණ ද වර්තමාන කාලයෙන් ලියා තිබුණ ද ලකුණු පිරිනමන්න.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම. | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස්වීම, සම බවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩුවීම. | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩුවීම. | ලකුණු 4ට අඩු |

සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම. | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මකභාවය දක්නට නොලැබීම,<br>නිරවුල් නොමැතිවීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | 3-1 |

ශිල්පීය දක්ෂතා - ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත්අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදි ඡේද වෙන්කිරීම,<br>අක්ෂර වින්‍යාස රීති භාවිතය. | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත්අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | 1 |

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. ඒ අනුව සංශ්ලේෂණ හැකියාව මෙහි ලා විමසීමට ලක් කෙරේ.

ඉගෙනුම් පල -

- ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

3. පහත දැක්වෙන පාඨය වචන 65 - 75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

19 වන සියවසේ දී ජනසන්නිවේදනය ලොව පුරා වඩාත් ප්‍රචලිත වන්නට විය. එමගින් නව සංස්කෘතියක් බිහිවන්නට වූ අතර එම සංස්කෘතිය වඩා වේගයෙන් ලොව පුරා ව්‍යාප්ත වන්නට වූයේ වඩාත් ජනප්‍රිය වෙමිනි. මෙහි ආරම්භක මාධ්‍යය වශයෙන් කටයුතු කළේ පුවත්පත යි. පුවත්පත මගින් ඇති කළ මේ නව සංස්කෘතිය විද්‍යුත් මාධ්‍යවල ප්‍රභවය සමග වෙනස් වූ අතර එම තත්ත්වය රූපවාහිනී මාධ්‍යය අත්කර ගන්නා ලද්දේ ග්‍රාහකයාගේ නිවසේ අනිවාර්ය මෙවලමක් බවට පත්වෙමිනි. ගුවන්විදුලි මාධ්‍යයේ ම දිගුවක් වශයෙන් බිහි වූ රූපවාහිනී මාධ්‍යය හුදකලා මාධ්‍යයක් ලෙස ගොඩනැගුණක් නො වේ. එය සිනමාව, නිශ්චල ඡායාරූපය හා ගුවන් විදුලි මාධ්‍යය ආශ්‍රයෙන් බිහි වූ මාධ්‍යයක් වේ. එහෙත් මේ සියලු මාධ්‍යයන්ට වඩා රූපවාහිනී මාධ්‍යය ග්‍රාහකයාට සමීප වූ අතර එය ගෘහස්ථ භාණ්ඩයක් බවට පරිවර්තනය විය. ඒ නිසා රූපවාහිනිය වඩා ප්‍රබල මාධ්‍යයක් වෙමින් ලෝකය පුරා ප්‍රචලිත විය.

රූපවාහිනී මාධ්‍යයේ ශක්‍යතා හා තාක්ෂණික ප්‍රවණතා පදනම් කර ගනිමින් රූපවාහිනියට දේශසීමා හඹා යාමේ හැකියාව අත් වූ අතර එයින් ලෝකය වඩාත් අන්‍යෝන්‍ය වශයෙන් සමීප විය. සන්නිවේදන ක්‍රියාවලියේ දී වඩාත් ප්‍රබල මාධ්‍යයක් වීමට අවකාශය සලසා ගන්නා ලද්දේ එමගින් ය. අද්‍යතනයේ දී ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වී ඇති අතර එකී විශ්ව ගම්මානයක ජනමාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. සීමා මායිම් අතික්‍රමණය කරමින් ගොඩනැගී ඇති මේ නව්‍ය වූ ලෝකයේ ජනතාවගේ දැනුවත් බව උදෙසා තොරතුරු සන්නිවේදනය කෙරෙන මාධ්‍යයක් වශයෙන් ද විනෝදාස්වාදන මාධ්‍යයක් වශයෙන් ද රූපවාහිනිය ඉතා වැදගත් සාධකයක් බවට පත් ව තිබේ.

(ලකුණු 10 යි)

**සාරාංශකරණය :**

**අන්තර්ගතය**

(i) 19 වන සියවසේ ජනසන්නිවේදනය ප්‍රචලිත වීම සමග නව සංස්කෘතියක් බිහි විය.

(ii) මෙහි ආරම්භක මාධ්‍යය පුවත්පත යි.

(iii) සිනමාව, නිශ්චල ඡායාරූප හා ගුවන්විදුලි මාධ්‍ය ආශ්‍රයෙන් බිහි වූ රූපවාහිනිය විසින් පුවත්පතට හිමි තැන අත්පත් කර ගන්නා ලදි.

(iv) ලෝක සන්නිවේදන ක්‍රියාවලියේ දී රූපවාහිනිය ප්‍රබල වූයේ රූපවාහිනී මාධ්‍යයේ ශක්‍යතා හා තාක්ෂණ ප්‍රවණතා පදනම් කර ගනිමිනි.

(v) විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති ලෝකයේ, ප්‍රමුඛ ජන මාධ්‍යය රූපවාහිනිය යි.

(vi) ජනතාවගේ දැනුවත් බව උදෙසා තොරතුරු සන්නිවේදනයේ හා විනෝදාස්වාදයේ මාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය ප්‍රබල මෙවලමකි.

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

| | | |
|---|---|---|
| 01. | අන්තර්ගතය - | ලකුණු 06 යි. |
| 02. | වචන ගණන - | ලකුණු 02 යි. |
| 03. | ශිල්පීය දක්ෂතා - | ලකුණු 02 යි. |

* වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.



CamScanner

* ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
* වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බිත්දුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු 6ක් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වාගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන 65-75 අතර පැවතීම. | ලකුණු 05-06 |
| ප්‍රධාන කරුණු 4-5ක් පමණ ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැකගැනීම, වචන ගණන 55-65 අතර පැවතීම, නිරවුල්බව රැකගැනීම. | ලකුණු 03-04 |
| ප්‍රධාන කරුණු 4ට වඩා අඩුවෙන් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 55ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01-02 |

ප්‍රශ්න අංකය 04

අපේක්ෂණය - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

ඉගෙනුම් පල -

- අවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ළමා සාහිත්‍යයේ අරමුණ විය යුත්තේ සාහිත්‍ය කටයුතු අනුසාරයෙන් නිරවද්‍ය චින්තනයෙන් ප්‍රභාවිත විවිධ විෂයයන් හා විපුල ක්‍රමයන් පිළිබඳ සාරගර්භ ශික්ෂණයක් හා නිර්මාණ ක්‍රියාවේගයන් ජනනය කෙරෙන ශික්ෂණයක් කරා බාල පරපුර මෙහෙයවීම යි. අස්වාභාවික නොවන සේ රචිත විධිමත් ළමා සාහිත්‍ය කෘති මගින් ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වළක්වාලීමට සැලකිය යුතු පිටුබලයක් සැපයෙයි. මූලික වශයෙන් වර්ග දෙකකට බෙදෙන ළමා සාහිත්‍ය කෘතිවලින් එක් වර්ගයක් සෞන්දර්යාවබෝධය හා වින්දනය ලබා දීමේ කරණීය ආකල්ප තහවුරු කරයි. අනෙක් වර්ගය ළමයා අවට ලෝකයේ පවතින විවිධ ධර්මතා පිළිබඳ අවබෝධය ලබා දෙයි.

ළමා ලෝකයේ පවතින රසවත් සංකල්පනා පදනම් කර ගැනුණු රචනා කියවීමට ළමයින් තුළ පවතින්නේ බලවත් ආශාවකි. ජනකතා, ජන ගී, ජන කාව්‍ය ආදි ජනශ්‍රැති අංග කෙරෙහි ද ස්වකීය ආගමික සිතුම්-පැතුම් හා ප්‍රතිඥාවන් වස්තු බීජ කර ගත් සරල නිර්මාණ කෘති කෙරෙහි ද ළමා රුචිය ඉස්මතු වෙයි. ස්වභාවධර්මයේ විවිධාංග, විද්‍යාංග, ඓතිහාසික වෘත්තාන්ත හා තත්කාලීන සිදුවීම් යනාදි විෂයයන් පිළිබඳ ව ළමා මනස මෙහෙයවීමට සූක්ෂ්ම ලෙස නිර්මාණය කෙරෙන කෘති යොදා ගත හැකි ය. දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල ස්වභාව විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මූල දැනුමක් ලබා දෙමින් රචිත පොත්වලට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. එම කෘති මගින් ළමයින්ගේ චින්තන ශක්තිය පුළුල් වේ. ස්වභාවධර්මය පිළිබඳ විමසිල්ලෙන් පරීක්ෂා කොට, එය අබිබවා ක්‍රියා කිරීමේ හැකියාව වර්ධනය වේ. ලෝකයේ සැම රටක ම වෙසෙන ළමයින් සාමාන්‍යයෙන් ඒකාකාර වුව ද ඔවුන් සඳහා ලියැවෙන කෘති රටින් රටට වෙනස් වේ. එසේ වෙනස් වන්නේ විවිධ චර්යාවන් හා ඒවායේ ප්‍රතිඵලවලින් ගොඩනැගී ඇති පුරුෂාර්ථ ගැබ්කොට ගත් සංස්කෘතික රටාවේ බලපෑම නිසා ය. මේ අනුව විමසිලිමත් වන විට බටහිර රටවල ළමා සාහිත්‍ය කෘතිවලට වඩා ලංකාවේ ළමයින්ට ආසියාතික රටවල නිර්මාණය වූ කෘති ප්‍රියජනක වන බව පෙනේ.

ළමා සාහිත්‍ය කෘතීන්හි භාෂාව කෙරෙහි ද අපගේ අවධානය විශේෂයෙන් යොමු විය යුතු වේ. ළමයින් කතා කරන භාෂාව ග්‍රන්ථ භාෂාවට වඩා ප්‍රාණවත් ය. මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන පොත් ළමා ව්‍යවහාරානුසාරී වූ ද මානසික පරිසරයට අනුකූල වූ ද භාෂා ස්වරූපයෙන් යුක්ත විය යුතු ය.

(i) ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වැළැක්වීමට උපකාරී වන්නේ කවර වර්ගයේ කෘති ද?

(ii) මේ ඡේදයේ දැක්වෙන ජනශ්‍රැති අංග මොනවා ද?

(iii) ළමා මනස මෙහෙයවීමට සූක්ෂ්ම ලෙස නිර්මාණය කෙරෙන කෘති සඳහා යොදා ගත හැකි විෂයයන් **දෙකක්** නම් කරන්න.

(iv) දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල විශේෂ අවධානයක් යොමු වන්නේ කවර වර්ගයේ කෘති කෙරෙහි ද?

(v) මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන කෘතිවල භාෂා ස්වරූපය කෙබඳු විය යුතු ද?

(ලකුණු $02 \times 5 = 10$ යි)

(i) අස්වාභාවික නොවන සේ රචිත විධිමත් ළමා සාහිත්‍ය කෘති

(ii) ජනකතා, ජන ගී, ජන කාව්‍ය

(කරුණු 3ක් ඇත්නම් ලකුණු 2 යි. කරුණු 2කට ලකුණු 1 යි. එක් කරුණක් ඇත්නම් ලකුණු හිමි නො වේ.)

(iii) ස්වභාවධර්මයේ විවිධාංග, විද්‍යාංග, ඓතිහාසික වෘත්තාන්ත, තත්කාලීන සිදුවීම්

(iv) ස්වභාව විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මූල දැනුමක් ලබා දෙමින් රචිත පොත් කෙරෙහි ය.

(v) ළමා ව්‍යවහාරානුසාරී වූ ද මානසික පරිසරයට අනුකූල වූ ද භාෂා ස්වරූපයෙන් යුක්ත විය යුතු ය.

(කරුණු දෙකක් පමණක් අපේක්ෂා කරන අවස්ථාවල කරුණු ගණන අනුව ලකුණු දෙන්න.)

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ඉගෙනුම් පල -

- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.



CamScanner

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන **දැන්වීම් පත්‍රිකාවක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)
**'උදාර'** යනු පෞද්ගලික කර්මාන්තායතනයක සේවක සුභසාධක සංගමයකි. එහි මාසික රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කෙරිණි.

- තම සංගමය මගින් සමාජ සත්කාර සේවා රැසක් සිදු කරන බව
- වාර්ෂික ලේ දන් දීමෙ කඳවුර 2022 වර්ෂයේ ද සංවිධානය කළ යුතු බව
- එය දෙසැම්බර් 20 දින සිදු කළ යුතු බව
- ලේ දන් දීමේ කඳවුර සඳහා කර්මාන්තශාලාවේ සේවක විවේකාගාරය සූදානම් කළ යුතු බව

උදාර සුභසාධක සංගමයේ ලේකම් 'දේවිකා අබේරත්න' ඔබ යයි සිතන්න.

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **රාජකාරි ලිපියක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)
**'සමගිපුර'** ග්‍රාම සංවර්ධන සමිතියේ මෙවර රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය විය.

- සමගිපුර ගම මැදින් වැටී ඇති දුම්රිය හරස් මාර්ගය අනතුරු බහුල ස්ථානයක් වී ඇති බව
- දුම්රිය ගේට්ටුවක් නොමැතිකම මීට ප්‍රධාන හේතුව වී ඇති බව
- මේ වන විටත් ජීවිත හානි කිහිපයක් ම සිදු ව ඇති බව
- දුම්රිය ගේට්ටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දුම්රිය අධිකාරිවරයාගෙන් ඉල්ලීමක් කළ යුතු බව

සමගිපුර ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් 'රසික ආරියරත්න' ඔබ යයි සිතන්න.

(ලකුණු 15 යි)

**දැන්වීම් පත්‍රිකාව**

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.**

1. ආකෘතිය ලකුණු 04 යි.
2. අන්තර්ගතය ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 04 යි.**

1. මාතෘකාව ලකුණු 01 යි.
2. දැනුම් දෙන්නේ කවුරුන් ද යන වග ලකුණු 01 යි.
3. කරුණු ඉදිරිපත් කිරීමේ සංවිධානාත්මක බව හා නිර්මාණශීලිත්වය ලකුණු 02 යි.

**2. අන්තර්ගතය - ලකුණු 08 යි.**

1. උදාර සේවක සුභසාධක සංගමය මගින් සමාජ සත්කාර සේවා රැසක් සිදු කරන බව
ලකුණු 02 යි.
2. වාර්ෂික ලේ දන්දීමේ කඳවුර 2022 වර්ෂයේ දී ද සංවිධානය කර ඇති බව
ලකුණු 02 යි.
3. දෙසැම්බර් මස 20 දින ලේ දන්දීමේ කඳවුර පැවැත්වෙන බව
ලකුණු 02 යි.
4. සේවක විවේකාගාරයේ දී ලේ දන්දීමේ කඳවුර පැවැත්වෙන බව
ලකුණු 02 යි.

3. **ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.
- නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු ගණන 03කි.

**නැතහොත්**

**රාජකාරී ලිපිය**

**ලකුණු විග්‍රහය මුළු ලකුණු - 15 යි.**

1. ආකෘතිය - ලකුණු 04 යි.
2. අන්තර්ගතය - ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

1. **ආකෘතිය - ලකුණු 04 යි.**

   1. යවන්නාගේ නම සහ ලිපිනය - ලකුණු 01 යි.
   2. ලබන්නාගේ නම සහ ලිපිනය - ලකුණු 01 යි.
   3. මාතෘකාව - ලකුණු 01 යි.
   4. අත්සන සහ දිනය - ලකුණු 01 යි.

2. **අන්තර්ගතය - ලකුණු 08 යි.**

   1. සමගිපුර ගම මැදින් වැටී ඇති දුම්රිය හරස් මාර්ගය අනතුරු බහුල ස්ථානයක් වී ඇත. ලකුණු 02 යි.
   2. දුම්රිය ගේට්ටුවක් නොමැතිකම ඊට ප්‍රධාන හේතුව යි. ලකුණු 02 යි.
   3. මේ වන විටත් ජීවිත හානි කිහිපයක් සිදුවී ඇත. ලකුණු 02 යි.
   4. දුම්රිය ගේට්ටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දුම්රිය අධිකාරිවරයාගෙන් සිදු කරන ඉල්ලීම. ලකුණු 02 යි.

3. **ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

   නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

   * නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
   * නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03කි.

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෘතිය නිර්මාණය කළ කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**ලකුණු විග්‍රහය** - මුළු ලකුණු 20 යි.

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පුරුදු මඟේ දී කැලයට වැදිලා
........................................ .........
මැදින් දිමෙන් දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා
(අ) මෙම කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.
(ආ) ජනවාරි මාසය හැඳින්වීමට කවියේ යෙදී ඇති වචනය කුමක් ද?

(ii) ස ත් ත න් සිහින් ගෙඩි සෙවණලු වැලි තෙලෙන
තැ ත් තැ න් වල ම සැතැපී සියුමැලි බැවින
ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අතින
ය ත් ම න් තොසින් මඟ තොරතුරු නියම දැන
(අ) මෙම පද්‍යය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස ලියන්න.

(iii) "ඔව්! හැමදේම බැහ්! බැහ්! කට විතරයි හොල්ලන්න පුළුවන්. අනක් හොල්ලන්න එපා!"
(අ) මෙම ප්‍රකාශය කළ අයගේ නම කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව ලියන්න.

(iv) දෑසේ කඳුළැලි පිසදා බලහෙම්
හෙට හිරු එළියට වඩින දිනෝ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ
(අ) මෙම පද්‍යය ඇතුළත් පැදි පෙළෙහි රචකයා කවරෙක් ද?
(ආ) පුංචි පුතා රජ කරනු පෙනෙන්නේ කවර අවධියක ද?

(v) "ගං ඉවුරෙ අලි ඇට නරි අදිනවා කියලා අපිත් අලි ගශේ තාන්තෙ නැතුව අරිනවා ද?"
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය හා සබැඳුණු අවස්ථාව කුමක් ද?

(vi) "සොළු පච්චු දුෂ්ට අධාර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල"
(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෘතිය නම් කරන්න.
(ආ) මෙහි 'බමුණු මහල්ල' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇති තැනැත්තාගේ නම කුමක් ද?

(vii) "අපි ආපු පාර දිගේ ආපහු පයින් ම මං යන්නම්" යි ඔහු කී ය. "පයින් ම ගිහිල්ලා හොයා ගන්න පුළුවන් ද කියලා බලන්නම්"
(අ) මෙම කොටස උපුටා ගත් නිර්මාණයේ මුල් රචකයාගේ නම ලියන්න.
(ආ) මෙහි සඳහන් තැනැත්තා සොයා ගැනීමට උත්සාහ කළේ කුමක් ද?

(viii) "තමන් පානා කෙළි තමන් ම දක්නා පමණ මුත් රැස් වූවවුන් නො බලන නියාව දැන මුසුප්පු ව ගොසින්"
(අ) මෙහි 'තමන්' යනුවෙන් හැඳින් වූ අයගේ නම කුමක් ද?
(ආ) රැස් වූ පිරිස බලා සිටියේ කවුරුන් දෙස ද?

(ix) (අ) හංස සන්දේශය රචනා වී ඇත්තේ කවර යුගයක ද?
(ආ) හංස සන්දේශය මගින් සෙත් පැතීමට අපේක්ෂා කෙරෙන්නේ කිනම් රජතුමාට ද?

(x) (අ) සිංහල භාෂාවෙන් ලියැවී ඇති පැරණි විනය ග්‍රන්ථයක් නම් කරන්න.
(ආ) කුස ජාතක කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවරෙක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)



CamScanner

(i) (අ) මසක් පමණ කල් කැලවල් කොටා ලා

(ආ) දුරුතු/ දුරුතු මහ

(ii) (අ) සැළලිහිණි සන්දේශය

(ආ) මාර්ගයේ තොරතුරු නියම ආකාරයෙන් දැනගෙන සිතේ සතුටින් යන්න.

(iii) (අ) හේරත් / පටබැඳිගේ හේරත්

(ආ) කුරක්කන් ඇඹරීම සම්බන්ධයෙන් අක්කා සහ මල්ලී (කථකයා) අතර සංවාදයේ දී තාත්තා (හේරත්) පැමිණි අවස්ථාව

(iv) (අ) මහගමසේකර

(ආ) ණය නැති, බිය නැති නිවහල් යුගයක/ නිවහල් යුගයක

(v) (අ) පුංචිරාළ/ වෙදරාළ/ අලුත් මුලාදෑනියා

(ආ) සිරගත වූ තම සැමියා වන බබුන් ගැන පුංචි මැණිකා පුංචිරාළ නම් අලුත් ගම් මුලාදෑනියාගෙන් විමසූ අවස්ථාව/ බබුන් ගැන පුංචි මැණිකා පුංචිරාළගෙන්/ ගම්මුලාදෑනියාගෙන් විමසූ අවස්ථාව

(vi) (අ) උම්මග්ග ජාතකය/ පන්සිය පනස් ජාතක පොත

(ආ) කේවට්ටාචාරීන්/ කේවට්ටයා/ කේවට්ට බමුණා

(vii) (අ) ගී ද මෝපසාං/ මෝපසාං

(ආ) නැති වූ මාලය/ දියමන්ති මාලය

(viii) (අ) උග්ගසේන/ උග්ගසේන සිටුපුත්‍රයා

(ආ) බුදුරජාණන් වහන්සේ දෙස/ බුදුන් වහන්සේ දෙස

(ix) (අ) කෝට්ටේ යුගයේ

(ආ) හයවෙනි පැරකුම්බා (පරාක්‍රමබාහු) රජුට/ සිරි පැරකුම්බා රජුට

(x) (අ) සිබවළඳ හා සිබවළඳ විනිස

(ආ) අලගියවන්න මුකවෙටිතුමා

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

ඉගෙනුම් පල -

- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- ගුත්තිල කවියා යොදා ගත් කාව්‍ය උපක්‍රම අගය කරයි.
- සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට පෙළ අවබෝධයෙන් යුතු ව කියවා අවස්ථා සම්බන්ධ ඉදිරිපත් කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සන්දේශ කවිවල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.

- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය නිවැරදි ව දක්වයි.
- නිර්දිෂ්ට ගද්‍ය කොටසේ (උම්මග්ග ජාතකය) භාෂා භාවිතය පිළිබඳ අදහස් දක්වයි.

ලකුණු විග්‍රහය - **මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)**

(අ) කොටස **ලකුණු 02 යි.**

(ආ) කොටස **ලකුණු 02 යි.**

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) මෙහි දැක්වෙන උපමාව කුමක් ද?

(ආ) පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(ii) කිම ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය
ඇසෙන මෙ අරුමා

(අ) මැණියන් තම දරුවන් අමතා පවසන්නට යෙදුණු කාරණය කෙටියෙන් ලියන්න.

(ආ) මැණියන්ගේ ප්‍රකාශයෙන් අනතුරුව සිංහබාහු ක්‍රියා කළ ආකාරය කෙබඳු දැයි විස්තර කරන්න.

(iii) "මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්හු ඔවුන් දැකැ වෙවුලන් මැ යැ. පලන් මැ යැ. දොරපියා-ලන් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම අසමින් පලා **වලට** හො වදිති. ගෙට වැදැ දොර පියා-ලා අගුළු හෙ‍ා ගන්කි. පලා නො යා හෙන්නාහු පිටි පෑ සිටුති. මහතෙරහු **සරළුවක්** හඹු දූ කෙණෙස්සක් බතු දූ නො ලැබෙති."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) අඟුල්මල් තෙරුන් දුටු මිනිසුන් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iv) නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණුය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන **දකුණුය**
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද **පැදකුණුය**

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) පරිසරයේ සුන්දරත්වය හා මිනිසුන්ගේ ක්‍රියාකලාප ගැන කවියා දක්වා ඇති තොරතුරු මොනවා ද?

(v) "සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන් තොපගේ අභීත ශබ්දයෙන් ම උන් භය ගන්වා සමුගුරු බා ලා සියලු රා මස් පිරූ සැළවල් බිඳ තූ තූ කොට පියා වහා රා මස් අවුළු විසුරුවා නො කෑ හැකි පරිද්දෙන් කොට දිවිමෙන් ගොස් සේනා මධ්‍යයට වැද, ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන් මහත් අරගල කොට, 'අපි මියලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයම්හ. පිළිවන් වී නම් අප අල්ලා ගනුව' යි තොප ගිය බව හඟවා එව".

(අ) මෙම පාඨයේ දැක්වෙන උපමා **දෙක** උපුටා ලියන්න.

(ආ) මහෞෂධ පණ්ඩිතයන් යෝධයන්ට මෙලෙස උපදෙස් දීමට හේතු වූ කාරණය කෙටියෙන් ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

(i) (අ) දිසි මෙන් විය විදුලිය සිය දහසී/ විදුලිය සිය දහසක් දිස් වූවාක් මෙන්

(ආ) • දිව්‍ය විලාසිනීන් පහත බලා ගත් ඇසින් හෙළන්නා වූ බැල්මෙන් විශේෂයෙන් ජනයාගේ සිත්



CS CamScanner

ඒකාන්තයෙන් මත් කොට, ආකාශයෙන් බැස නැටුම් ගත් ලීලාව කවරකාර ද? විදුලිය ලක්ෂ ගණනක් එක විට දිස් වූවාක් මෙන් විය.

- දිව්‍යාංගනාවන් ඇස් යටින් බලන්නා වූ බැල්මෙන් විශේෂයෙන් ජනයාගේ සිත් අනිවාර්යයෙන් ම වසඟ කොට අහසින් බැස නැටූ ආකාරය විදුලිය සිය දහස් ගණනක් එක වර දිස් වූවාක් මෙන් විය.

(ii) (අ) ප්‍රසිද්ධ වංග දේශයේ රජතුමාගේ දියණිය බව/ තමා රාජකුමාරිකාවක බව

(ආ) තම මෑණියන්ගේ වදන් විශ්වාස කළ නොහැකි ව පුදුම විම. මෙතෙක් කල් සිංහබාහු තමා නොදැන සිටි කාරණයක් දැන ගැනීමෙන් කලබලයට හා කුතුහලයට පත්වීම සහ තම රාජකීය උරුමය සොයා පිටත්ව යෑම.

(iii) (අ) වලට - කැලෑවට/ වනයට/ වනාන්තරයට/ බැද්දට

සරළුවක් - හැන්දක්/ හැන්දක් පමණ

(ආ) මිනිස්සු අඟුල්මල් තෙරුන් දැක අධික ලෙස බියට පත්වී වෙවුලති; පලායති; දොරවල් වසා ගනිති; පලා ගොස් කැලයට වදිත; ගෙට ඇතුළු වී දොරවල් වසා අගුළු දා ගනිති; පලා යන්නට නොහැකි අය තෙරුන්ට පිටු පා සිටිති.

(iv) (අ) දකුණුය - දක්ෂිණා ය/ දාන ය (පරිත්‍යාග ය)

පැදකුණුය - ප්‍රදක්ෂිණා ය/ තම දකුණු අත ගරු කළ යුතු වස්තුව හෝ පුද්ගලයා දෙසට සිටින සේ එය වටා ගමන් කිරීම

(ආ) <u>පරිසර සුන්දරත්වය</u>

නොයෙක් තැනම පිපුණු මල් පිරුණු පොකුණු ඇත. මිදුල් හා මාවත් කුණු කසළවලින් තොර ව සුදු පැහැයෙන් දිස්වේ.

<u>මිනිසුන්ගේ ක්‍රියා කලාපය</u>

ගෙයක් පාසාම ශ්‍රද්ධාවෙන් දන් දීමත් සිය ගණන් පිරිස විහාරය වදිමින් පුදමින් ප්‍රදක්ෂිණා කිරීමත් ය.

(v) (අ) සිංහ නාද ඇසූ මුව පොල්ලන් / සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන්

ශක්‍ර පුරයට වන් අසුර භටයන් / ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන්

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා, කේවට්ට බමුණා සමග එක්ව තමාට යටත් වූ රජ දරුවන් මරණයට පත් කිරීමට සූදානම් කළ විෂ සුරා පාන මණ්ඩපය විනාශ කළ යුතු නිසා (ජයපානෝත්සවය මුළුමනින් ම විනාශ කළ යුතු නිසා.)

(මෙම අදහස ලියවී ඇත්නම් ලකුණු ලබා දෙන්න)

3 ප්‍රශ්නය

**ඉගෙනුම් පල**

- අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය ගැන සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට ගද්‍ය කොටස (උම්මග්ග ජාතකය) රස විඳිමින් විචාරය කරයි.
- ගුත්තිල කවියා යොදා ගත් කාව්‍ය උපක්‍රම අගය කරයි.
- නිර්දිෂ්ට පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

3. • චූලනී බ්‍රහ්මදත්ත රජුගේ චරිතයත්
   • වෛදේහ රජුගේ චරිතයත්

   උම්මග්ග ජාතකයේ නිරූපණය කර ඇති ආකාරයෙන් ස්ඵුට වන්නේ රාජ්‍ය පාලනයේ දී කෘතහස්ත උපදේශකයන්ගේ සේවයේ අවශ්‍යතාව යි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

   **නැතහොත්**

   - භාෂාව සුමට ලෙස හසුරුවා ගැනීම
   - අවස්ථෝචිත ලෙස සිද්ධි පෙළ ගැස්වීම මගින්

   ගුත්තිල කවියාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය පිළිබිඹු කෙරෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

   (ලකුණු 15 යි)

**චූලනී බ්‍රහ්මදත්ත රජු හා කේවට්ට බමුණාගේ උපදෙස්**

- චූලනී බ්‍රහ්මදත්ත රජුට අනෙකුත් රාජ්‍යයන් තමන්ට නතු කර ගැනීමේ ආශාව ඇති කිරීමෙන් රාජ්‍ය ලෝභය ඇති වීම

  උදා-'' මා කීවා කරන සේක් නම් සියලු දඹදිවට නුඹ වහන්සේ අග රජ කොට ලමි''
- රාජ්‍ය පැහැර ගැනීම හා එකී රාජ්‍යවල රජවරුන් මරණයට පත් කිරීම මගින් ආක්‍රමණ සිතුවිලි හා ප්‍රාණඝාත අකුසලයට රජතුමා යොමු කිරීම

  උදා- ''උන් හැමදෙනා රා බොන්නට යැයි රා මැඩිල්ලේ හිඳුවාලා විෂ යොදා කරන ලද්දා වූ රා අනුභව කරවා උන් හැම දෙනා ම ජීවිත විනාශයට පමුණුවා ගඟ දියට දමා...''
- රජ දරුවන් මැරීමේ උපක්‍රමය මහෞෂධ පඬිතුමා ව්‍යර්ථ කළ කල්හි මියුලු නුවර ආක්‍රමණය කිරීමේ දැඩි අධිෂ්ඨානය වැළැක්වීමට කේවට්ට බමුණාට නොහැකි වීම හා වැටලූ අවස්ථාවේ දෙනු ලැබූ උපදෙස් ක්‍රියාත්මක කිරීම

  උදා-'' වෛදේහ රජ්ජුරුවන්ගේ හිස තල්පැන් පලක් මඩනා සේ කඩුවෙන් කපා පියා...''
- දර, පැන් හා ධාන්‍ය වළක්වා මියුලු නුවර පරාජය කිරීමට උත්සාහ කිරීම

  උදා-'' නුවරට පැන් නම් පිටතින් වන්නේය. නුවරට වී සාල් නම් පිටතින් ම වන්නේය. ඒ වී සහල් වැද්ද නොදෙම්හ.''

  ''දර නවතාලා නුවර ඇර ගනුම්හ''
- කෙසේ හෝ මියුලු නුවර අල්ලා ගැනීමට උපක්‍රම සොයන කේවට්ට බමුණා ධර්ම යුද්ධය ක්‍රියාත්මක කිරීම

  උදා-'' මහරජ දෙසේනාව සටන් නොකොට මැනව. රජ දරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක තැනකට එද්ද, ඉන් එක් කෙනෙක් වැන්ද වූ නම් වැදි පක්ෂයේ රජහට පරාජය වන්නේ ය''

- **මෙතෙක් අපරාජිත ව සිටි චූලනී බ්‍රහ්මදත්ත රජු කේවට්ට බමුණාගේ අදූරදර්ශී උපක්‍රම හා නිර්ලජ්ජ ක්‍රියාවන් නිසා පරාජිතයකු වීම**
  උදා- "නැගී සිටුව! ආචාරීනි, නැගී සිටුව! මා නොවදුව යි කිය කියා..."

ඉහත උදාහරණ හෝ ඊට සමාන අයුරින් උදාහරණ දක්වමින් කේවට්ට බමුණාගේ උපදෙස් අනුව ක්‍රියා කිරීමට යාමෙන් චූලනී බ්‍රහ්මදත්ත රජු පරාජිතයකු බවට පත් වූ ආකාරය ලියා තිබීම අවශ්‍ය ය.

**වෛදේහ රජු හා මහෞෂධ පඬිවරයාගේ උපදෙස්**

- රාජ්‍ය ආරක්ෂාව සුරක්ෂිත කිරීමට දූරදර්ශී උපක්‍රම ක්‍රියාත්මක කිරීම
  රාජ්‍ය රහස් ඔත්තු සේවාව සඳහා ගිරා පෝතකයකු පුරුදු පුහුණු කිරීම
  උදා-"කේවට්ටය, තෝ තමාගේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණය යැයි සිතයි ද? දැන් ම සකන් වැ ගියේය..."
- රාජ්‍යයට පිටින් එන ආක්‍රමණවල දී සිදු වන ව්‍යසන අවම කර ගැනීමට උපක්‍රම යෙදීම
  උදා- ඇතුළු නුවර සිටි දිළින්දන් පිටි නුවර පදිංචි කරවා පිටි නුවර දනව්වලින් සතර වාසල නියම් ගම් සතරින් වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධ වූ ඉසුරුමතුන් ගෙන්වා ඇතුළු නුවර වැස්වූ සේක; බොහෝ ධනධාන්‍ය රැස් කරවූ සේක"
- අනෙකුත් රාජ්‍යවල සිදු කරන රාජ්‍ය පරිපාලන කටයුතු මත තම රාජ්‍යයේ සුරක්ෂිතභාවය තව දුරටත් තහවුරු කර ගැනීමට තමාගේ චරපුරුෂයන් එකී රාජ්‍යවල සේවය සඳහා යොමු කිරීම
  උදා- මියුලු නුවර වටලන අවස්ථාවේ තොරතුරු ලබා ගැනීම
- චූලනී බ්‍රහ්මදත්ත රජු හා කේවට්ට බමුණා එක්ව එක් සියයක් රජ දරුවන් මරා දැමීමට කළ උත්සාහය ව්‍යර්ථ කිරීම
- විවිධ උපක්‍රම යොදා මියුලු නුවර ග්‍රහණයට ගැනීමට සූදානම් වූ අවස්ථාවේ උපායශීලී ව රජුත් රාජ්‍යයත් බේරා ගැනීමට ප්‍රති උත්තර සැපයීම නිසා ම විශාල සේනාවකට කුඩා රාජ්‍යය නතු කර ගැනීමට නොහැකි වීම
  උදා- දර, පැන් හා ධාන්‍ය තම රාජ්‍ය තුළ අවශ්‍ය ප්‍රමාණයටත් වඩා තිබෙන බව පෙන්වීම
- වෛදේහ රජු සේනාවට බියෙන් සිටිද්දී රාජ්‍යයේ රජුත් ජනතාවත් ආරාක්ෂා වන පරිදි අවශ්‍ය මානසික ශක්තිය ලබා දෙන මහෞෂධ පඬිවරයා ඒ සියලු වගකීම තමා වෙත පවරා ගැනීම
  උදා- ධර්ම යුද්ධයේ දී අෂ්ටවංක මාණික්‍යය යොදා ගෙන කේවට්ට බමුණා පරාජිතයකු බවට පත් කිරීම

විශාල සේනාවක් සමග චූලනී බ්‍රහ්මදත්ත රජු කේවට්ට බමුණාගේ උපදෙස් අනුව මියුලු නුවර වැටලීමට පැමිණි අවස්ථාවේ දුර්වල පාලකයකු වූ වෛදේහ රජුට ජයග්‍රාහී ලීලාවෙන් ඊට මුහුණ දීමට හැකියාව ලැබුණේ මහෞෂධ පඬිතුමාගේ කෘතහස්ත උපදෙස් අනුව ක්‍රියා කිරීම නිසා ය.

නැතහොත්

භාෂාව සුමට ලෙස හසුරුවා තිබීමත් අවස්ථෝචිත ලෙස සිද්ධි පෙළගැස්වීමත් මගින් ගුත්තිල කවියා සිය ප්‍රතිභාපූර්ණ කවිත්වය පිළිබිඹු කරන ආකාරය නිදසුන් දක්වමින් විස්තර කර තිබීම අපේක්ෂිත ය.

- **භාෂාව සුමට ලෙස හසුරුවා තිබීම**
  උදාහරණ
- ගුත්තිල ඇදුරු      සඳ
  වීණා වයන ලෙස      ඉඳ



CamScanner

- දෙදෙන ම ඉඳ    දෙපිට
  සව් සත සතන් තුටු    කොට
- නවතා    ගිගිරියේ
  අසන ලෙස සිත් පිරියේ
- දෙවෙනි තුන්වෙනි    තත
  සතර වැනි පස් වැනි    තත
- අප බෝසතුන්    මිස
  අනෙකෙකු නොම අසන    ලෙස

  වෙනත් සුදුසු උදාහරණ දක්වා ඇත්නම් ඒවා ද සැලකිල්ලට ගන්න.

- **අවස්ථෝචිත ලෙස සිද්ධි ගැළපීම**
  - ගුත්තිල ඇදුරුතුමා වීණා වාදන මණ්ඩපයට පැමිණි අවස්ථාව
    ගුත්තිල ඇදුරු    සඳ
    වීණා වයන ලෙස    ඉඳ
  - මූසිල සබයට පැමිණි අවස්ථාව
    නොදැන ම තමා    බල
    සබයට අවුත්    නොපැකිළ
  - ගුත්තිල ඇදුරුතුමා සහ මූසිල වීණා වාදනය ආරම්භ කළ අවස්ථාව
    දෙදෙන ම ඉඳ    දෙපිට
    සව් සත සතන් තුටු    කොට
  - ගුත්තිල ඇදුරුතුමාට ශක්‍රයා විසින් වීණාවේ තත් සිඳීමට කියූ අවස්ථාව හා ඒ අනුව තත සිඳ දැමීම
    ගුත්තිල මහ    සිපී
    සක් දෙව් බසින්    සැතපී
    මින් දිනමැයි    දැපී
    බමර තත පළමුවෙන්    සිඳපී
  - මූසිල වීණාවේ තත් කැඩූ අවස්ථාව
    කෙළෙහි ගුණ    සින්දේ
    මූසිල    අන්දමන්දේ
    ජයෙහි ලොබ    බැන්දේ
    තමා වීණා තත ද    සින්දේ
  - ගුත්තිල ඇදුරුතුමාගේ වීණා වාදනය ලෝකය පුරා පැතිරී ගිය අවස්ථාව
    දිය දිය ගොස පළ කරමින් සපැමිණි
    ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
  - පරිසරයේ ජීව වස්තු ප්‍රතිචාර දැක්වූ අවස්ථා
    පිය සත් නොව බිඟු දැල් රැඳි    කොපුලී
    අවසන් නොව වෙණ නදට ම    කුහුලී
    මඳ සන්සුන් පියොවින් සිටි    නොසැලී
    ගජසෙන් සිතියම් ගජ සිරි    කියෙලී

පැතිරෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
අතිනවි ගිලිහෙන බව නොම   දත්තෝ

මත්මත් කරවන දන මුළු   දෙරණා
රසවත් වන වෙණ නද නද   කරනා
සවනොත් සඳ පුරඟන ලොබ   දිවුණා
නොදනිත් දරුවන් ඇකයෙන්   වැටුණා

- සුරඟනන් පැමිණ නර්තනයේ යෙදුණු අවස්ථාව
  රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දී විදුලිය   පබා
  රත් රසේ එක් වන ලෙසේ වෙණ නාදනු පා තබ   තබා
  වෙනත් සුදුසු උදාහරණ සපයා ඇත්නම් ඒවා ද සැලකිල්ලට ගන්න.

**ප්‍රශ්න අංකය 04**

ඉගෙනුම් පල

- 'වස්සානය' කවි පෙළ රස විඳිමින් විචාරය කරයි.
- 'අපට වැසිකිළියක්' කෙටිකතාව රස විඳිමින් විචාරය කරයි.

4.
- අජීව වස්තූන්ට සජීව ස්වරූපය ආරෝපණය කිරීමත්
- උචිත බස් වහරක් යොදා ගැනීමත්

'වස්සානය' කවි පෙළෙහි සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

- ගැමි බස්වහරක් යොදා ගැනීමත්
- සිද්ධි හා අවස්ථා මනා ලෙස ගැළපීමත් නිසා

'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක ආකර්ෂණය දිනා ගැනීමට සමත් ව ඇත.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

**අජීව වස්තූන්ට සජීවත්වයක් ආරෝපණය කිරීම**

කවියා සොබා දහමේ අජීව වස්තූන් සජීවත්වයෙන් රූපණය කර ඇත්තේ ඒවායේ නේකවිධ ක්‍රියාකාරකම් ප්‍රකට කරවමිනි.

''ඔය දෑල දොඩමලු ය සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක''

''කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට''

"සෙනෙහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ"

"නහර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින"

"ඔබෙ සිනාවෙන් නිවේ හුණු ව ගිය ලේ නහර"

"වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින"

"ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව

ඇදී ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය"

**උචිත බස් වහරක් යොදා ගැනීම**

- රූපකාර්ථවත් යෙදුම්
  "ඔය දෑල දොඩමලු ය"
  "නිල් වතුර තුරුලු කර"
  "සුදු මල් පොකුර වඩා ගෙන"
  "වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින"
- උපමා භාවිතය
  "සොඳුර නුඹ වාගේ ම හිනැහේ ය මා එක්ක"
  "මිහිරි මවුකිරි වගේ පොවන්නෙමි නුඹලාට"
- ව්‍යංගාර්ථවත් යෙදුම්
  කවියා මෙම පද්‍ය පන්තියේ දී පරිසරයේ සෞන්දර්ය නිරූපණය කරමින් ජීවිතය පිළිබඳ විග්‍රහයක් ව්‍යංග්‍යයෙන් ඉදිරිපත් කරයි. ජීවිතයේ දුෂ්කරතා ජය ගනිමින් අභියෝගවලට මුහුණ දිය යුතු බව කවියා මෙහි දී ප්‍රකාශ කරයි. ශුභවාදී ආකල්ප පෙරදැරි කර ගෙන ජීවිතය පිළිබඳ බලාපොරොත්තු දල්වා ගත යුතු ආකාරය 'හුලංදා ඔය' සංකේත කොටගෙන ව්‍යංග්‍යාර්ථවත් ව ඉදිරිපත් කරයි.
- කථකයාට තමාගෙන් දුරස් ව සිටින පෙම්වතිය/බිරිඳ සිහිපත් වීම
  "ඔය දෑල දොඩමලු ය..."
  "කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට"
- කථකයා තම ප්‍රියාවගෙන් වෙන් ව ගත කරන හුදකලා ජීවිතය
  " වැහි වලාකුළු රංචු..."
- ජීවිතයේ අභියෝගවලට නොබිය ව මුහුණ දී ජය ගත යුතු බව
  "ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව
  ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය."
- ව්‍යවහාර භාෂාවේ යෙදුම් උචිත පරිදි යොදා ගැනීම
  "ඔය දෑල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට, වඩා ගෙන හිනැහේය, ඉගිල්ලී වරෙන්, ලගින, ඉකි ගැසූ"

**නැතහොත්**

ගැමි බස් වහරක් යොදා ගැනීමත් සිද්ධි හා අවස්ථා මනා ලෙස ගැළපීමත් නිසා 'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක ආකර්ෂණය දිනා ගෙන ඇති ආකාරය නිදසුන් සහිත ව විස්තර කිරීම අපේක්ෂිත ය.

**ගැමි බස් වහරක් යොදා ගැනීම**

ගැමි වහරේ වචන, විශේෂ යෙදුම්, උච්චාරණ විලාසය, සජීව හා තාත්ත්වික දෙබස් ඛණ්ඩ, ඉංග්‍රීසි බසින් බිඳ ගත් ගැමි වචන ආදිය උචිත පරිදි යොදා ගනිමින් ඉතා රසවත් බසකින් කෙටිකතාව ඉදිරිපත් කිරීමට රචකයා සමත් ව ඇත.

- ගැමි වචන
  කක්කුස්සිය, පිල, අද්දර, බයාදු, පුළුවනෑ, මගෝඩිය, බැද්ද
- විශේෂ යෙදුම්
  සෙල්ලම් නටන්න, තැම්ම හදලා දෙන්ට, තෝ හොර අලියා, කැම්පීම් සේරම, කොහෙන් පහළ වුණා ද?, බැද්දට පාත් වෙන්න, උසාවි බඩ ගාන්න, ආණ්ඩුවෙන් පඩි කකා, වී ඇටේ අහුලපු කිකිළි කරපු දේ
- ගැමි උච්චාරණය සහිත සජීව සංවාද
  "ඔව්! හැමදේම බැහ්! බැහ්! කට විතරයි"
  "කුණු ඉස්පැට්ටර තිකෝනිස්කාරයගෙ ගෙදෙට්ට ගිහිං ඇහැව්වලු..."
  " ෂික් විතරක් ගඳ ගහන් නැද්ද"
  "පොඩි ළමයෙක් ගෙයි කැත කළොත් ඒක අස් කර දමනකල් හිරිකිත නැද්ද?"

**සිද්ධි හා අවස්ථා මනා ලෙස ගැළපීම**

- ගැමි කුටුම්බයක වැඩිහිටි සහෝදරියකගේ වගකීම සිද්ධි හා අවස්ථා ඇසුරෙන් චිත්‍රණය කර තිබීම

" හෙට උදේට කුරහන් රොටී ටිකක් හදන්න කුරහන් ටික අඹරගන්න උදවු වෙනව ද මල්ලියේ?"
"ඇයි මල්ලි එහෙම කියන්නෙ? අසනීපෙන් ඉන්න අම්මට පුළුවන් ද ඕව කරන්න."

- අලුත් වැසිකිළි සෑදීමට උපදෙස් දීම සඳහා සෞඛ්‍ය පරීක්ෂක ගමට පැමිණීම හා සම්බන්ධ සිද්ධි හා අවස්ථා නිරූපණය

" අයියෙ, අයියෙ, පොලිස්කාරයෙක්" හදිසියේ ම හතිලමින් අප වෙත දුවගෙන ආ පොඩි මල්ලී දෑත් වනමින් මට කතා කළේ ය.
"කුණු ඉස්පැට්ටර! සුගතන් තම හඳුනා ගැන්ම පිළිබඳ ව උපන් ගර්වයෙන් යුතු ව කීය.

"අද උදේ හිටන් පන්සල් ගොඩැල්ලෙ හැම ගෙදරකටම ගිහින් තියෙනව. කක්කුස්සි නැති හැමෝමට නඩු දානවලු..."

"තිකෝනිස් කිව්වලු අනේ බුදු මහත්තයෝ මෙහෙ මොන කක්කුස්සි ද ඔන්න මතනින් ඔය බැද්දට පාත්වෙන්න."

- සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් පරිදි නව වැසිකිළියක් තනා ගැනීමට විවිධ වූ අපහසුතා මැද ගැමියන් සූදානම් වන ආකාරය උචිත සිද්ධි හා අවස්ථා ඇසුරෙන් නිරූපණය කිරීම



CamScanner

"මේ කැලෙන් වටවෙලා ඉන්න අපට මොන කක්කුස්සි ද? නීතියෙන් බේරෙන්ඩ හැදුවයි කියමු. ගෙයක් ඇතුළෙ ඉඳගෙනත් ඔය වැඩේ කළ හැකි ද? කාට පුළුවන් උණත් මට නම් බෑ."

"ලැල්ල දැම්මට වැසිකිළියක් හැදෙනවද මිනිහෝ? ...

"නෑ ආයිබෝවන්, මේ දවස් ටිකේ එක දිගටම කුඹුරු වැඩ තිබුණා. ඒකයි ඉවර කරන්න බැරි වුණේ. "

- නිසි සනීපාරක්ෂක පහසුකම් භාවිත කරමින් වැසිකිළි භාවිතය සඳහා ගැමියන් අනුගත වූ ආකාරය නිරූපණය කර තිබීම

"ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න ? "

"එහෙම නම් අපට පෙරේතයො කොහොමටවත් පෙනෙන්නෙ නෑ නොවැ . "

"ඕක ඔය තරම් අඩබෙර ගහන්න දෙයක් නෙවෙයි. දැන් කවුරුත් කැලෑ ගානෙ රිංගන්නෙ නෑ."

"පසුදින උදේ නංගි වෙනදාටත් කලින් ගෙයින් දොරට බැස්සාය. වතුර පනිට්ටුවක් පුරවා ගත් ඈ වැසිකිළියට වැදී දොර වසා ගත්තා ය. එදින ම මල්ලිත් දිනකින් දෙකකින් අක්කාත් අම්මාත් ඈ අනුකරණ කළහ."

"...දැන් අප එය හඳුන්වන්නේ ද වැසිකිළිය කියා නොව කක්කුස්සිය යනුවෙනි. දැන් එය තාත්තාට වුව ද ප්‍රයෝජන ගැනීමට අසීරු නොවන ස්ථානයක් වී ඇත."

මෙවැනි අවස්ථා හා සිද්ධි ඇසුරෙන් පාඨක ආකර්ෂණය දිනා ගැනීමට කතුවරයා සමත් වී ඇති ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කර තිබිය යුතු ය.

| | |
|---|---|
| ❖ 3, 4 පිළිතුරු සඳහා උදාහරණ 4ට | ලකුණු 04 යි. |
| සමස්ත විස්තරයට | ලකුණු 11 යි. |
| | මුළු ලකුණු 15 යි. |

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

**ප්‍රශ්න අංකය 05**

ඉගෙනුම් පල

- 'බැද්දේගම' නවකතාවේ නිර්දිෂ්ට කොටසේ ගැබ් වූ නවකතා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- 'බැද්දේගම' නවකතාව රස විඳිමින් විචාරය කරයි.

5. බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන්නේ නූගත් ගැමි ජනතාවගේ අව්‍යාජ සිතුම් පැතුම් ය. නිර්දිෂ්ට කොටස ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන්නේ නූගත් ගැමි ජනතාවගේ සිතුම් පැතුම් බව නිදසුන් සහිත ව විස්තර කිරීම

- ශ්‍රී ලාංකික සමාජයක ගැමි පරිසරයේ පවුලක පියා සහ ස්වාමි පුරුෂයා අහිමි වීමෙන් කාන්තාවක මුහුණ දෙන අසරණභාවය
  උදා : බබුන් සිරගෙට නියම වීමත් ඇගේ පියා ඇට නැති වීමත් නිසා පියාගේ ඉරණම පිළිබඳ ව ඇගේ සිතේ පැවති බියත් නිතර ඇගේ දුක හා දොම්නස දියුණු කළේය.

  ආරච්චි මායියා හැම දාමත් කිවේ මේ ගම කිසි කලක කිසි කෙනෙකුට වගතුවක් නොවන සාප ලත් ගමක් බව ය.

- බබුන් සිරගත වූ කාල සීමාව කොතෙක් දැයි නිශ්චිත ව නිගමනය කිරීමට නොහැකිවීම බැද්දේගම වැසියන්ගේ නූගත්කමත් අව්‍යාජත්වයත් පිළිබිඹු කරයි.
  ''වැපුරුවා විතරක්නෙ දැන්. නෑ, නෑ, නෑ තුන් මාසෙකට කලින් වෙන්ඩ ඕනෑ. මෝඩයා තුන්මාසයක්? මොකද කුරක්කන් අනූ දා වී වගේ ද? මෝඩයා? කවුද දන්නෙ නෑ මෝඩයා කටවහපන්....."

- පුංචි මැණිකා අලුත් ගම්මුලාදෑනියා වන පුංචිරාළගෙන් බබුන් පිළිබඳ විමසීම
  "රාළහාමි ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද? එයා මළයි කියලා දැන ගන්ඩ ලැබුණ ද? "

- හිරගෙදර අසල දී මුණ ගැසුණු මහල්ලා පුංචි මැණිකා සමග ආගිය තොරතුරු කතා කිරීමෙන් පසු දුන් උපදේශයේ දී
  "ඉතින් මගෙ මිනිහා, සියේ? එයාට මොකද වුණේ "

- හිරපල්ලා පුංචි මැණිකාගේ නූගත්කමින් හා දුප්පත්කමින් අයුතු ප්‍රයෝජන ගැනීමට ගත් උත්සාහය
  "නෑ අයියා, සතයක්වත් නෑ. අපි බොහොම දුප්පත් මිනිස්සු. "

- පුංචි මැණිකාට මහල්ලා පළමුවර හමුවුණු අවස්ථාවේ දී ම ඇය තමා පැමිණි කාරණය ව්‍යක්ත ව ප්‍රකාශ කිරීම
  "එයා මේ හිරගෙදර එව්වා, මාස ගණනකට ඉස්සර, ඒක බොරු නඩුවක්. එයා මාස හයකට හිරේට නියම වුණා."

  යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කර තිබිය යුතු ය.

**ප්‍රශ්න අංකය 06**

ඉගෙනුම් පල

- 'අඟුල්මල් දමනය' කතාවෙහි අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව රස විඳිමින් විචාරය කරයි.

6. අඟුල්මල් දමනයෙහි දැක්වෙන දිසාපාමොක් ඇදුරු චරිතය මඟින් විදහා දැක්වෙන්නේ ද අර්බුද හමුවෙ මිනිස් සිත ක්‍රියා කරන සාමාන්‍ය ස්වභාවය යි. අමාවතුර නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)



CamScanner

'අඟුල්මල් දමනයෙහි දැක්වෙන දිසාපාමොක් ඇදුරු චරිතය මගින් විදහා දැක්වෙන්නේ අර්බුද හමුවේ මිනිස් සිත ක්‍රියා කරන සාමාන්‍ය ස්වභාවය යි' යන්න පැහැදිලි වන අයුරින් කරුණු ඉදිරිපත් කර තිබීම අවශ්‍ය ය.

- ආචාර්යවරයාගේ භාර්යාව හා අහිංසක පිළිබඳ වැ අනෙකුත් ශිෂ්‍යයන් ආචාර්යවරයා වෙත පැමිණ පළමු අවස්ථාවේ දී කරන ප්‍රකාශ පිළිගැනීමට මැළි වීම

"යටත්නි, මපුතු මා කෙරෙහි නො බිඳැ-පියටියාව" යි නෙරැ-පී යැ.

- දෙවන තුන්වන අවස්ථාවල දී යළි එම තොරතුර තහවුරු කිරීමට ශිෂ්‍යයන් ගන්නා උත්සාහය හමුවේ ගුරුවරයාගේ සිත විපිළිසර වීම හා අහිංසක මරන්නට සිතක් ඇති වීම

  'ඇය හා ඔහු සසඟ ඇති සෙ යැ' යි බිඳී 'ඔහු මරමි' සිතී.

- අහිංසක මැරුව හොත් තමාට සිදුවන අලාභය ගැන ඔහුගේ සිත දෙගිඩියාවකට පත්වීම හා ඔහුට එයින් සිදුවන අලාභය ගැන සිතා බැලීම

  "දිසාපාමොක් ඇදුරු තමා කරා ශිල්ප උගන්නට ගිය දරුවන් දොස් දක්වා මරයි, කියා වටාලා ශිල්ප උගන්නට එන්නෝ නො වෙති. එ සෙ වන්නා හා මට ලාභ පිරිහෙයි."

- ඒ සඳහා වෙනත් උපක්‍රමයක් වෙත යොමු වීම

"එ සෙ බැවින් ශිල්ප සමහරයට උපචාර යැයි කියා මිනිස්දහසක් මරන්නට කියමි. එකාන්තයෙන් එයින් එකෙක් ඔහු මරයි."

- තමන් අන්‍යයන්ට හිංසා නොකරන කුලයක උපන් බව අහිංසක ප්‍රකාශ කරන විට ඊට දිසාපාමොක් යොදන උපක්‍රමය ද මිනිස් සිතේ ක්‍රියාකාරිත්වය පෙන්වයි. "ශිල්පයට උපහාර නොකරන්නා එල නො දෙයි පුතැ' යි කී යැ."

තම භාර්යාවට දඬුවමක් දීමට මැළි වන ඔහු අහිංසකගේ ජීවිතය විනාශ කිරීම සඳහා කටයුතු යොදයි. මිනිස් සිත ක්‍රියාකරන සාමාන්‍ය ස්වභාවය මෙම සිදුවීම් මගින් මනාව පිළිබිඹු වේ.

මෙම කරුණු හා වෙනත් යෝග්‍ය කරුණු උදාහරණ ලෙස දක්වමින් විස්තර කරමින් ලියා තිබීම අපේක්ෂිත ය.

ප්‍රශ්න අංකය 07

ඉගෙනුම් පල

- නිර්දිෂ්ට කවි පෙළෙහි (ගංගාවේ සංගීතය) නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- කවි පන්තිය රස විඳිමින් විචාරය කරයි.

7. මිනිස් දිවිය සහ සොබා දහම සංකලනය කරමින් ජීවන දර්ශනයක් මතුකොට දැක්වීමට කවියා ගෙන ඇති උත්සාහය කෙතෙක් දුරට සාර්ථක වී ඇද්දැ යි 'ගංගාවේ සංගීතය' පැදිපෙළ ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

මිනිස් දිවිය සහ සොබාදහම සංකලනය කරමින් ජීවන දර්ශනයක් මතු කොට දැක්වීමට කවියා ගෙන ඇති උත්සාහය සාර්ථක වී ඇති ආකාරය පැදිපෙළ ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.

- විවිධ අභියෝග ජය ගනිමින් ජීවිතයේ ඉලක්කය කරා නො නැවතී ගමන් කළ යුතු ආකාරය ගංගාව ඇසුරෙන් නිරූපණය කිරීම



CS CamScanner

සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි

ඇඹරෙමි - එහෙත් පසුනොබසිමි - නොනවතිමි

කවදා කොතැනකදි හෝ මහ මුහුද හිමි

හමුවුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

- සංසාර ගමනේ ස්වභාවය නිරූපණය කිරීම
  එන්නේ කොහි සිට ද - කොතැනකට ද යන්නේ

- ජීවිතයේ අනියත ස්වභාවය ද සොබාදහම ඇසුරෙන් ප්‍රකට කිරීම

මී අඹ කිරල මාදම් ගෙඩි ළදරු වියේ

ඇකයෙහි හෙළා හඬවයි සැඬ සුළඟ රැයේ

- ජීවිතයේ පත්නරය ලැබීමට අභියෝග අවශ්‍ය බව ප්‍රකාශ කිරීම

හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරි තම

ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම

- ජීවිතයේ සනාතන දහම අවබෝධ කිරීම

නොමියන හේලි දහමක පණිවුඩය පිට

කොඳුරමි කෙඳිරියක් මුළු ලොව නිසල කොට

යෝග්‍ය උදාහරණ තුනක් දක්වමින් විස්තර කර තිබීම අපේක්ෂිත ය.

❖ 5, 6, 7 පිළිතුරු සඳහා උදාහරණ 3ට ලකුණු 03 යි.
සමස්ත විස්තරයට ලකුණු ලකුණු 07 යි.
මුළු ලකුණු 10 යි.